ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

පටුන

		පිටු අංක.
1.0	විධායක සාරාංශය	1
	1.1 හැඳින්වීම	1
	1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු.....	1
	1.3 ප්‍රධාන කාර්යයන්	2
	1.4 සංවිධාන ව්‍යුහය	3
	1.5 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අංශ	4
	1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්	4
2.0	ප්‍රගතිය හා අනාගත දැක්ම	5
	• කර්මාන්ත සේවා අංශය	5
	• සංවර්ධන අංශය	9
	• විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය	17
	- ඉදිකිරීම් මෙහෙයුම් ශිල්පී ඒකකය	17
	- ඉදිකිරීම් උපකරණ නඩත්තු පුහුණු ඒකකය	21
	• කර්මාන්ත පුහුණු අංශය	28
	• නිවාස සැලසුම් හා ගොඩනැගිලි සඳහා මධ්‍යස්ථානය	30
	• මානව සම්පත් හා පරිපාලන අංශය	34
	• මූල්‍ය අංශය	39
3.0	මූල්‍ය ප්‍රකාශන	48
4.0	කාර්ය සාධන දර්ශක	90
5.0	මානව සම්පත් පැතිකඩ	91
6.0	අනුකූලතා වාර්තාව	92

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

1.0 විධායක සාරාංශය

1.1 හැඳින්වීම

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන යටතේ ඉදිකිරීම් පුහුණු හා සංවර්ධනය සඳහා ආයතනයේ (ICTAD) අනුප්‍රාප්තිකයා ලෙස ස්ථාපිත කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

"ගෝලීය ප්‍රමිතීන් හා සමාන්තර දිවෙන විශ්වාසනීය හා යෝග්‍ය වූ ඉදිකිරීම් කර්මාන්තයන් ශ්‍රී ලංකාවේ බිහිකිරීම"

මෙහෙවර

"ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය හරහා රෙගුලාසි පැනවීම, ශක්‍යතා වර්ධනය සහ නැංවීම මඟින් තිරසාර ජාතික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ගෝලීය සහ දේශීය අවශ්‍යතාවයන් සපුරාලිය හැකි උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය තුළින් ශක්තිමත් මෙන්ම වෘත්තීය තත්ත්වයෙන් යුතු කර්මාන්තයන් සහතික වීම තුළින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපායශීලී නායකත්වයක් ලබාදීම"

අරමුණු

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි දීර්ඝ වූ නිල නාමය මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි සමස්ථ අරමුණු සහ ඉලක්කයක් පහත පරිදි පිළිබිඹු කරයි.

"ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහාද, ඉදිකිරීම් සම්බන්ධව ජාතික උපදේශන සභාව පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුදල පිහිටුවීම සඳහාද, කර්මාන්තයට අදාළ වෘත්තිකයන්, නිෂ්පාදකයන් ,සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිසද, ඉදිකිරීම් කටයුතු වලට අදාළ ආරවුල් නිරවුල් කිරීම සඳහාද, ශ්‍රී

ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සහ ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

1.3 ප්‍රධාන අරමුණු

- ගරු අමාත්‍යතුමාගේ මහ පෙන්වීම හා සමගාමීව ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික වීම.
- ඉදිකිරීම් අංශය තුළ තිරසාර වර්ධනය, ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම තීව්‍ර කිරීම අරමුණු කර මෙම කර්මාන්තයේ නිරතව සිටින පාර්ශවකරුවන්ට අවශ්‍ය නායකත්වය ලබාදීම.
- වරින් වර නියම කරනු ලබන ආකාරයට ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම.
- බලශක්තිය කාර්යක්ෂමව පරිභෝජනය කළ හැකි වන ආකාරයට ගොඩනැඟිලි සහ ආකෘති සැලසුම් කිරීම සඳහා විශේෂ අවධානයන් යොමු කිරීමෙන් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තයට සහ එහි වර්ධනයට අදාළ වන්නා වූ ඕනෑම කරුණක් පිළිබඳව පර්යේෂණ කටයුතු ප්‍රකාශයට පත් කිරීම සහ ඒවා ව්‍යාප්ත කිරීම සහ නිසි පර්යේෂණයන් ප්‍රවර්ධනය කිරීම.
- අනෙකුත් අදාළ බලධාරීන්ගේ උපදෙස් සමඟ ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් විධිමත්ව සකස් කිරීම සහ ඒවා අනිවාර්ය සහ ඉච්ඡානුගත ප්‍රමිතීන් වශයෙන් වර්ග කිරීම.
- බලධාරියා විසින් විධිමත්ව සකසා ඇති පරිදි පරිවයන්, ක්‍රියාපටිපාටීන් හා ක්‍රියාවලීන් සහ ඉදිකිරීම් කර්මාන්තයට අදාල ප්‍රලේඛනයන් ක්‍රියාවට නැංවීම.

පනතේ දක්වා ඇති සියලුම කාර්යයන් ආවරණය කරමින් අදාළ කාල රාමුව තුළ ඒවා ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගනිමින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඇත. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තිය , ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත හා 2020 – 2024 දක්වා කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අනුගමනය කරමින් 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.

2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් කාල ඉලක්කයන් සමඟ හා එක් එක් ක්‍රියාකාරකම් වලින් අපේක්ෂිත ආදායම සහ ලබාගත් ප්‍රගතිය අදාල අංශ යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

1.4 සංවිධාන ව්‍යුහය


ජාතික උපදේශන සභාව
කළමණාකරන මණ්ඩලය
සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (කර්මාන්ත සේවා)
අධ්‍යක්ෂ (කාර්මික පුහුණු)
අධ්‍යක්ෂ (විදයුත් යාන්ත්‍රික සේවා)
අධ්‍යක්ෂ (මූල්‍ය)
අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)
සංවර්ධන අංශය
අ) කර්මාන්ත සංවර්ධනය
ආ) කොරතුරු කළමණාකරනය
ඇ) නාක්ෂණ හා පර්යේෂණ
කර්මාන්ත සේවා අංශය
අ) උපදේශන සේවා
ආ) ඉදිකිරීම් ආර්ථිකය
කාර්මික පුහුණු අංශය
අ) ශිල්පී පුහුණු (NVQ මට්ටම IV සහ ඊට අඩු)
ආ)පර්යේෂණ හා සංවර්ධන
ඇ) කළමණාකරන හා අධීක්ෂණ මට්ටම පුහුණු (NVQ මට්ටම V - V II)
විදයුත් යාන්ත්‍රික සේවා අංශය
අ) කර්මාන්ත සහය
ආ) ඉදිකිරීම් උපකරණ පුහුණු
ඇ) ඉදිකිරීම් උපකරණ
මූල්‍ය කළමණාකරන අංශය
අ)ගිණුම්කරනය, අයවැය හා කළමණාකරන තොරතුරු
ආ)තොග හා ප්‍රග්ධන වත්කම් කළමණාකරනය
ඇ)අරමුදල් කළමණාකරණය, ආදායම් හා ගෙවීම්
මානව සම්පත් හා පරිපාලන අංශය
අ) මානව සම්පත්
ආ)පරිපාලන හා නඩත්තු
කාර්ය සාධන අධීක්ෂණ ඒකකය
අභ්‍යන්තර ඒකකය

1.5 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අංශ

පහත සඳහන් පරිදි මෙහෙයුම් අංශ 04 හතරක් මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සිය කාර්යයන් ඉටු කරන අතර සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයා විසින් මෙහෙයවනු ලැබේ.

අ. කර්මාන්ත සේවා අංශය

ආ. සංවර්ධන අංශය

ඇ. විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය

ඈ. කාර්මික පුහුණු අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

I. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදලේ අරමුදල - අභ්‍යන්තර අරමුදල

II. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල - ස්ථාපිත කිරීම සඳහා

2.0 ප්‍රගතිය හා අනාගත දැක්ම

කර්මාන්ත සේවා අංශය

කර්මාන්ත සේවා අංශය විසින් තාක්ෂණික පිරිවිතරයන්, සම්මත ලංසු ලියකියවිලි සහ ඉදිකිරීම් සංඛ්‍යාලේඛන පිළිබඳ තොරතුරු ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීම, තාක්ෂණික හා ප්‍රසම්පාදන ගැටළු පිළිබඳ උපදේශනාත්මක සේවා සැපයීම, ආරවුල් විසඳීමේ විකල්ප පරිපාටි සඳහා පහසුකම් සැලසීම, තාක්ෂණික විගණනයන් සිදු කිරීම, ඉදිකිරීම් ආර්ථිකය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, විනිශ්චය කරුවන් ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීම හඳුනාගත් ඉදිකිරීම් කාර්යයන් පිළිබඳ ලේඛන පවත්වා ගැනීම මඟින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා පහසුකම් සැපයීම හා නියාමනය සිදු කරයි. ඉදිකිරීම් කර්මාන්තය ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ඉදිකිරීම් කාර්යයන් විධිමත් කිරීම, සුසංගත කිරීම හා ක්‍රමානුකූල කිරීම මගින් මෙම විසින් ඉදිකිරීම් කර්මාන්තයේ සේවාදායකයන්, උපදේශකයින්, කොන්ත්‍රාත්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ආයෝජකයින්, සැලසුම්කරුවන් ආදී ඉදිකිරීම් කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා මහපෙන්වමින් සේවා සපයයි.

කර්මාන්ත සේවා අංශය උප අංශ දෙකකින් සමන්විත වේ. ඒවා නම් උපදේශන සේවා අංශය සහ ඉදිකිරීම් ආර්ථික අංශයයි.

අ) <u>උපදේශක සේවා</u>

උපදේශක සේවා යනු ප්‍රාග්ධන සහ පුනරාවර්තන වැඩ ආවරණය කෙරෙන තාක්ෂණික, ආර්ථික සහ ඉදිකිරීම් විශේෂඥතාවය පිළිබඳ සංයෝජනයකි. රාජ්‍ය සහ පෞද්ගලික සේවාදායකයන් ගිවිසුම්ගත කරුණු පිළිබඳ පැහැදිලි අර්ථ නිරූපණ සහ උපදෙස් සෙවීම සඳහා වැඩිවෙමින් පවතින අතර ඉදිකිරීම් කර්මාන්තය වැඩිදියුණු කිරීම අප වෙත පැවරී ඇත.

2020 වර්ෂය තුළ උපදේශන සේවා උප අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- ආරවුල් විසඳීමේ සේවා සැපයීම සඳහා විනිශ්චයකරුවන් සංචිතයක් ලියාපදිංචි කිරීම. 2016 වසරේ සිට සීඩා වෙබ් අඩවියෙහි විනිශ්චයකරුවන්ගේ ලැයිස්තුව ප්‍රසිද්ධියට පත් කර ඇත. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත අනුව, විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීම අවශ්‍යතාවයකි. 2019 වර්ෂයේදී ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර විනිශ්චයකරුවන් 50 දෙනෙකු අධිකාරියේ ලියාපදිංචි කර ඇත. කොන්ත්‍රාත් සඳහා පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම මත 2020 වර්ෂය තුළ විනිශ්චයකරුවන් 13 දෙනෙකු පත් කරන ලදී.

- තත්ත්ව කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීම සහ හිමිකරු හෝ යම් රාජ්‍ය ආයතනයක ඉල්ලීම මත කිසියම් හඳුනාගත් ඉදිකිරීම් වැඩ පිළිබඳ තාක්ෂණික විගණනයන් සිදු කිරීම.

    1. බලපිටිය ප්‍රාදේශීය සභාව
    2. මීගමුව මහ නගර සභාව

❖ **ගැටුම් විසඳීමේ සේවා සඳහා බෙරුම්කරුවන් පත් කිරීම හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපදේශක සේවා ලබා දීම.**

ලංසු ලියකියවිලි, කොන්ත්‍රාත් පරිපාලනය, ආරවුල් විසඳීම, මිල උච්චාවචනය පිළිබඳ සීඩා වර්ගීකරණය, සීඩා සම්මත ලංසු ලියකියවිලි, තාක්ෂණික ප්‍රමිතීන්, තාක්ෂණික පිරිවිතරයන් සහ මාර්ගෝපදේශ ආදිය පිළිබඳ උපදේශක සේවා මෙම අංශය විසින් ලබා දෙනු ලැබේ.

ඉහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළව ගිවිසුම්ගත ආරවුල් සඳහා මුහුණ දුන් කොන්ත්‍රාත්කරුවන් විශාල සංඛ්‍යාවක් මෙන්ම රාජ්‍ය ආයතනද වාචිකව හා ලිඛිත උපදෙස් මෙම අංශයෙන් ඉල්ලා සිටින ලදී. 2020 වර්ෂයේදී ඉහත සඳහන් කරුණුවලට අදාළව උපදේශක සේවා 620 ක් ලබා දෙන ලදී.

2020 වර්ෂයේදී පහත සඳහන් සමථකරණයන් සිදුකරන ලදී.

1. සිලෝන් කන්ස්ට්‍රක්ෂන් 90 (පිවිටී) ලිමිටඩ් – මග නැගුම රෝඩ් කන්ස්ට්‍රක්ෂන් ඉක්විප්මන්ට් කම්පැණි, කාර්මික තාක්ෂණ ආයතනයෙන් මුදල් අයකර ගැනීම පිළිබඳ සමථකරණය.

2. ආර්.එම්. පෙරේරා (පිවිටී) ලිමිටඩ් – විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය. අභ්‍යන්තර වැඩ සඳහා අවසාන ගෙවීම් සහතිකය පිළිබඳ යෝජනාව - විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය.

3. මයික්‍රෝ කන්ස්ට්‍රක්ෂන් (පිවිටී) ලිමිටඩ් – ගුඩ් ෂෙපර්ඩ් කොන්වන්ට්, කොටහේන, කොළඹ 13 යෝජිත මහල් 3 ක ශ්‍රවණාගාර රැස්වීම් ශාලාව ඉදිකිරීම - අදියර I

- ඉදිකිරීම් කර්මාන්තයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් මඟින් දිස්ත්‍රික්ක 25 ක දැනුවත් කිරීමේ වැඩසටහන්. පහත සඳහන් පරිදි සීඩා කාර්යයන් සිදු කිරීම සඳහා දිස්ත්‍රික්ක 17 ක දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් තබා ඇත.

සීඩා ලියාපදිංචිය (C7 ට අඩු ලියාපදිංචිය, අලුත් කිරීම, වැඩිදියුණු කිරීම), ස්ථානීය පරීක්ෂාව (ඩෙංගු දැනුවත් කිරීම් පරීක්ෂා කිරීම, විශාල ව්‍යාපෘති පරීක්ෂාව ආදිය), උපදේශක සේවා, සම්මන්ත්‍රණ පැවැත්වීම, ශිල්ප ලියාපදිංචිය (NCASL සහ DS කාර්යාල පරීක්ෂාව), ශිල්ප කොන්ත්‍රාත් මොඩියුලය / කුසලතා සංවර්ධන වැඩසටහන , දිස්ත්‍රික් කමිටු රැස්වීම් සඳහා සීඩා නියෝජනය, හදිසි කාර්යාල වැඩ හා ප්‍රධාන කාර්යාලය පවරන ලද විශේෂ රාජකාරි සඳහා මාර්ගගතව ප්‍රතිචාරය (හරිත ද්‍රව්‍ය සමීක්ෂණ, මාර්ග සමීක්ෂණ, ඉදිකිරීම් සහ කඩා දමන අපද්‍රව්‍ය කළමනාකරණ සමීක්ෂණ, ප්‍රකාශන දත්ත රැස් කිරීම, ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ සමීක්ෂණ ආදිය.)

2020 වසරේ පවත්වන ලද දිස්ත්‍රික් මට්ටමින් සම්මන්ත්‍රණ

1. ඉදිකිරීම් වලදී කොන්ක්‍රීට් සහ ප්‍රතිසාධන.
2. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත් කළමනාකරණය.
3. කොන්ක්‍රීට් සහ R/f සැලසුම්.
4. ඉදිකිරීම් කර්මාන්ත ලංසු ක්‍රියාවලිය, ගෙවීම් සහ විචලනයන්.
5. රේට් විශ්ලේෂණය

ආ) ඉදිකිරීම් ආර්ථිකය

ඉදිකිරීම් ආර්ථිකය යනු ව්‍යාපෘතියේ ආරම්භයේ සිට අවසානය දක්වා ප්‍රායෝගික සහ තිරසාර මූල්‍ය තීරණ සහතික කරමින් ව්‍යාපෘතිය පුරාම සිදු කරන ඉදිකිරීම් ක්‍රියාවලිය සකසුරුවම් කිරීමේ ක්‍රියාවලියයි.

2020 වර්ෂය තුළදී ඉදිකිරීම් ආර්ථික උප අංශය මඟින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ දේශීය ඉදිකිරීම් කරුවන්ට ජාත්‍යන්තර තත්ත්වයන්ට පැමිණිය හැකි වන පරිදි හඳුනාගත් ඉදිකිරීම් කාර්යයන් සඳහා අවශ්‍ය පිරිවිතර, සම්මත ලියකියවිලි, සම්මත ලංසු ලියකියවිලි පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම ක්‍රියාවට නැංවීම සහ සංශෝධනය කිරීම වේ. 2020 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද ලියකියවිලි වූයේ,

1. කොවිඩ් -19 සහ ඩෙංගු සඳහා සෞඛ්‍ය සහ ප්‍රතිශක්තිය වැඩි දියුණු කිරීමේ මාර්ගෝපදේශය. (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ)
2. ජල සැපයුම් ජලය අපවහනය සහ වැසි ජලය අපවහනය සඳහා පිරිවිතරයන්. (SCA/3/2)
3. ඉදිකිරීම් සහ කඩා දමන ලද අපද්‍රව්‍ය කළමනාකරණය.
4. SBD කෙටුම්පත් - ප්‍රධාන කොන්ත්‍රාත් කෙටුම්පත් 2සහ SBD 4 - සැලසුම් සහ ගොඩනැගිලි කොන්ත්‍රාත් NPC සඳහා යවන ලදී.

- ඉදිකිරීම් සහ නඩත්තු වැඩ සඳහා ප්‍රසම්පාදන උපාය මාර්ග පිළිබඳ උපදෙස් දීම සහ විශේෂ පැවරුම් සඳහා උපදේශකවරුන්, විශේෂඥයින් හා ආයතන යෙදවීම.
- නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූලව සියලු නාගරික ඉදිකිරීම් නියාමනය සඳහා සියලු ගොඩනැගිලි ඉදිකිරීම් වලට අනුමැතිය ලබා ගැනීමට යන කාලය සති 3 දක්වා අඩු කිරීමට හා ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය දේශීය තත්ත්වයන් සිට ජාත්‍යන්තර තත්ත්වය දක්වා ගෙන ඒම සඳහා ජාතික ගොඩනැගිලි උපදෙස් මාලාව සකස් කර නිම කිරීමට හා ක්‍රියාත්මක කිරීමට පියවර ගනිමින් ඇත.
- ඉදිකිරීම් කර්මාන්තයේ දේශීය තත්ත්වය ජාත්‍යන්තර තත්ත්වයට ගෙන ඒම සඳහා ශ්‍රී ලංකාවට හැකිවන පරිදි අවශ්‍ය ඉදිකිරීම් සැලසුම් සකස් කිරීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනය, ඉංජිනේරු ආයතනය, විශ්ව විද්‍යාල සහ අනෙකුත් ආයතන සමඟ සහයෝගීත්වයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය හා සංරචක ශ්‍රේණිගත කර හරිත ක්‍රියාවලියකට යොමු කෙරේ.
- ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ වෙනසිවීම් සම්බන්ධයෙන් මාසික ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීම මඟින් ඉදිකිරීම් කර්මාන්තයේ පාර්ශවකරුවන් ප්‍රමිතිකරණය කිරීම.

ද්‍රව්‍යවල මිල, ශ්‍රම වේතන සහ පිරියත කුලී රේටයන් රැස්කර පරීක්ෂා කර දර්ශක සකස් කිරීම සඳහා විශ්ලේෂණය කෙරේ. මෙම ප්‍රකාශනය ඉදිකිරීම් ව්‍යාපෘතිවල මිල උච්චාවචනය ගණනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගැනේ. ඉදිකිරීම් කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා මෙම වර්ෂය තුළදී මෙම තොරතුරු ප්‍රකාශනයේ පිටපත් 760 ක් විකිණී ඇත. අගෝස්තු මාසයේ සිට තොරතුරු ප්‍රකාශනය සීඩා වෙබ් අඩවියේ නොමිලේ අය කිරීමකින් තොරව ප්‍රසිද්ධ කර ඇත.

තොරතුරු ප්‍රකාශයනය සමාලෝචනය කිරීම සහ උපදෙස් සඳහා පහත සඳහන් ආයතනවලින් සමන්විත කමිටුවක් ස්ථාපිත කරන ලදී.

1. මාර්ග සංවර්ධන අධිකාරිය
2. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
3. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නිර්මාණකරුවන්
4. තරුණ නිර්මාණකරුවන්ගේ සංසදය
5. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
6. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
7. රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව

• ඉංජිනේරු කාර්ය මණ්ඩලයක් නොමැති රජයේ නියෝජිතායතන සහ රජයට සම්බන්ධ ආයතන සඳහා වර්ෂය පුරා ව්‍යාපෘති කළමනාකරණ සේවා පැවැත්වීම.

තාක්ෂණික කාර්ය මණ්ඩලයක් නොමැති රාජ්‍ය ආයතන ඒවායේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවා මෙම අංශයෙන් නිතර ඉල්ලීම් කරත් මෙම සේවා රාජ්‍ය ආයතනවලට ලබා දෙන අතරතුර ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ ධාරිතාවන් ද අපි විසින් ගොඩනඟා ගනු ලැබේ. මෙම සේවා සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ උපදෙස්, ලංසු ලියකියවිලි පිළියෙල කිරීම, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකයවරුන් තෝරා ගැනීම, ලංසු ඇගයීම, කොන්ත්‍රාත් පරිපාලනය හා ගෙවීම් සහතික පිළියෙල කිරීම ආදිය ඇතුළත් වේ.

2020 වර්ෂයේදී ව්‍යාපෘති කළමනාකරණ සේවා සපයන ලද ප්‍රධාන ආයතනයන් පහත දැක්වේ.

1. පොල් සංවර්ධන අධිකාරිය
2. වෙන්දේසි ශාලාව අලුත්වැඩියා කිරීම
3. ශ්‍රී ලංකා තේ මණ්ඩලය
4. රසායනාගාර ගොඩනැගිල්ලේ හදිසි ගින්නකදී පිටවීම (Emergency - fire exit) සඳහා එකතු කිරීම් සහ වෙනස් කිරීම්

සංවර්ධන අංශය

1.0 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාතික ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ සැලැස්ම

ලියාපදිංචිය සහ ශ්‍රේණිගත කිරීම යනු යම් නිශ්චිත කොන්ත්‍රාත්තුවක් සඳහා යොමු කිරීමකින් තොරව විවිධ වර්ගවල හා ප්‍රමාණයන්වල ව්‍යාපෘති සිදු කිරීමේ සාමාන්‍ය හැකියාව තීරණය කිරීම සඳහා අනාගත කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් සඳහා පරීක්ෂණ ක්‍රියාවලියකි. කොන්ත්‍රාත්කරුගේ තාක්ෂණික හා මූල්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමෙන් ලියාපදිංචිය සහ ශ්‍රේණිගත කිරීම තීරණය වේ.

2020 වර්ෂය තුළදී නව ලියාපදිංචි කිරීම්, උසස් කිරීම් සහ ලියාපදිංචිය අලුත් කිරීම 2,019 ක් සිදු කරන ලදී.

(*) වෙබ් පාදක ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ අධීක්ෂණ පද්ධතිය (CCPMS) සහ ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය (NCIIS).

ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ අධීක්ෂණ පද්ධතිය (CCPMS)

මෙම පද්ධතිය සිඩා පනතේ 40 වැනි වගන්තිය ගැසට් නිවේදනය ප්‍රකාරව ස්ථාපිත කර ඇත.

අනන්‍ය වූ හා කොන්ත්‍රාත්කරුවන් සඳහා වෙන් වූ මෙම වෙබ් පාලන ප්‍රදේශය හරහා එක් එක් කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට ඔවුන්ගේ උපදේශකවරුන් සහ සේවාදායකයින් මඟින් ආපසු වාර්තා කළ යුතුය. මෙම පද්ධතිය කොන්ත්‍රාත්තුව සඳහා සේවා දායකයා, ඉංජිනේරු හෝ කොන්ත්‍රාත්කරු ඇතුලත් සියලුම පාර්ශ්වයන්ගේ යෙදවුම්, අදහස්, පසු විපරම භාවිතයට ගනී. එවැනි යෙදවුම්, අදහස්, පසු විපරම් රැස්කර අවසානයේ කොන්ත්‍රාත්කරු සඳහා ඇගයීම් කිරීමේ අරමුණින් විශ්ලේෂණය කෙරේ.

ඉහත C 4 යටතට ගැනෙන සියලුම කොන්ත්‍රාත්කරුවන් අධිකාරියට නියාමනය කිරීමට හැකිවන පරිදි පද්ධතිය සමඟ ලියාපදිංචි වීම අවශ්‍ය වේ.

දැනට ගණුදෙනුකරු / සේවාදායක ආයතන 134ක් මෙම පද්ධතිය සමඟ ලියාපදිංචි වී ඇත. කෙසේ වුවද උපදේශකවරුන් සහ ගණුදෙනුකරුවන් මෙම පද්ධතිය සඳහා පසු විපරම් කිරීම දුර්වල වේ. එබැවින් මෙම පද්ධතිය අඩු මට්ටමකින් ක්‍රියාත්මක වේ.

ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය (NCIIS)

ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය යනු ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය නියාමනය සහ වාර්තා කිරීම සඳහා සංවර්ධනය කරන ලද වෙබ් ද්වාරයයි. කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිය, ඉදිකිරීම් කර්මාන්ත රෙගුලාසි, ඕනෑම පුද්ගලයෙකුගේ භාවිතය සඳහා ඉදිකිරීම් ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ ජාතික දත්ත එයට ඇතුළත්ය. කර්මාන්තයේ දායක වන සාධකවල උච්චාවචනයන්, රජයේ නීති සම්පාදනයන්, රීති හා රෙගුලාසි සහ කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය සාධනය වැනි පවතින කරුණු අනුව එය නිතිපතා යාවත්කාලීන කෙරේ.

2017 සහ 2018 වර්ෂ තුළ ද්වාරයෙහි සංවර්ධන කටයුතු අවසන් කර ඇති අතර අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කර ඉදිකිරීම් කර්මාන්ත පනතට (CID) අනුව එයට නීතිමය සහාය ලබා දීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

ශ්‍රී ලංකාවේ වඩාත් ඵලදායි සහ ප්‍රතිඵලදායී කර්මාන්තයක් සඳහා පහසුකම් සපයන ලෝක ව්‍යාප්ත ඉදිකිරීම් ප්‍රජාවට ජාතික සේවාවක් ලෙස දත්ත එක් රැස් කිරීමේ යාන්ත්‍රණය ගැසට් කළ වහාම මෙම ද්වාරය වෙබ් ගත කිරීම සඳහා සැලසුම් කර ඇත.

මෙම පද්ධතිය 2021 මැද භාගයේදී ආරම්භ කිරීමට නියමිතය.

2.0 දේපල සංවර්ධනය කරන්නන් ලියාපදිංචි කිරීම

දේපල සංවර්ධනය කරන්නන් ලියාපදිංචි කිරීමේ අරමුණු වන්නේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම අවසාන පරිශීලක තෘප්තිය වර්ධනය කිරීම හා ආයෝජක විශ්වාසය වර්ධනය කිරීම සහ ආරවුල් අඩු කිරීම සහ කර්මාන්තයේ ප්‍රතිරූපය ගොඩනැගීමේ අරමුණින් දේපල සංවර්ධන කර්මාන්තය කාර්යක්ෂමව හා මනාව සංවිධිත කිරීමයි.

මේ දක්වා ක්‍රියාවලිය සහ ප්‍රගතිය

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත පනත අනුව සහ අංක 42 වගන්තියේ විධිවිධාන යටතේ රීති සහ අනුකූල ගැසට් නිවේදන අංක 2181/21 2020 ජූනි 25 දින ප්‍රකාශයට පත් කර ඇත.
මෙම අවශ්‍යතාවයට අනුගත වීම සඳහා දන්වමින් සියලු අපේක්ෂිත සංවර්ධකයින් සඳහා දැනුවත් කිරීමේ ලිපි යවා ඇත.

වර්ෂය අවසානයේ දේපල සංවර්ධකයින් 02 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර අයදුම්පත් 10 ක් පමණ මේ සඳහා යොමු වී ඇත.

3.0 විදේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ තාවකාලික ලියාපදිංචිය

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 39 වැනි වගන්තිය හා පසුව 2018 අගෝස්තු 23 දිනැති අංක 2085/19 දරන ගැසට් නිවේදනය මඟින් විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සහ යෙදවීම විධිමත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත්ව අනුමත කරන ලද උපමානයන් 2016 වර්ෂයේදී සියලු පාර්ශවකරුවන් නියෝජනය කෙරෙන කමිටුවක් මඟින් පිළියෙල කරන ලදී.

ඒ අනුව, ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනයේ විධිවිධාන තුළ කොන්ත්‍රාත්කරු යෙදවීම් ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා එය අත්‍යවශ්‍ය වනු ඇත. ඊට අමතරව, ගැසට් නිවේදනය නිකුත් කරන අවස්ථාව වන විටත් ව්‍යාපෘති ආරම්භ කර තිබූ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා දැඩි අවශ්‍යතාවයන් පිළිපැදීමෙන් තොරව සාධාරණ යාන්ත්‍රණයක් ද හඳුන්වා දෙනු ඇත.

තවද, සීඩා විසින් විදේශ කොන්ත්‍රාත්කරුවන්ට විශ්වසනීයත්වය සහ ප්‍රමිතීන් පවත්වා ගෙන යන අතරතුර යාන්ත්‍රණය තහවුරු කිරීම සඳහා ප්‍රතිලාභ කිහිපයක් ද පිරිනැමේ.

2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා විදේශීය කොන්ත්‍රාත්කරුවන් 08 දෙනෙකු සීඩා වෙත ලියාපදිංචි වී ඇත.

4.0 සුදුසුකම් ලත් පුද්ගලයන්/ආයතන ලියාපදිංචි කිරීම

ඉක්ටැඩ් ආයතනයේ නීත්‍යානුකූල අනුප්‍රාප්තිකයා වූ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට (සීඩා), ඉදිකිරීම් කර්මාන්තයේ නියාමන අධිකාරිය වශයෙන් 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ අංක 26 සහ 33 වගන්ති ප්‍රකාරව වෘත්තීයභාවය පිළිබඳ ප්‍රමිතීන් ප්‍රවර්ධනය සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් සහ පරිවයන් එනම් දේශීය හා විදේශීය සම්බන්ධයන් පිළිබඳ ලේඛනයක් පවත්වා ගැනීම සඳහා පැවරුම් බලයක් ලැබී ඇත.

පහත සඳහන් වර්ගයන්හි පුද්ගලයින් සහ උපදේශක පරිවයන් ලියාපදිංචි කිරීමට සීඩා තීරණය කර ඇත.

අ) 1968 අංක 17 දරන ලංකා ඉංජිනේරු ආයතනය පනත යටතේ ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ උපදෙස් ලබා ගැනීම.

ආ) ගෘහ නිර්මාණ ශිල්පය - 1976 අංක 1 දරන ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පී ආයතන පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනය හා ගෘහ නිර්මාණ ශිල්පී ලියාපදිංචි මණ්ඩලයේ උපදෙස් ලබා ගැනීම.

ඇ) ප්‍රමාණ සමීක්ෂක, 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක (සංස්ථාගත) ආයතන පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනයේ උපදෙස් ලබා ගැනීම පහත සඳහන් ලියකියවිලි පිළියෙල කර ඇති අතර 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් අපේක්ෂාවෙන් සිටී.

➢ ශ්‍රී ලංකා උපදේශක පරිවයන්

• ශ්‍රී ලංකා උපදේශක පරිවයන් පිළිබඳ ලියාපදිංචිය සඳහා රීති හා රෙගුලාසි
• ශ්‍රී ලංකා උපදේශක පරිවයන් පිළිබඳ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රය

➢ විදේශ උපදේශක පරිවයන්

• විදේශ උපදේශක පරිවයන් පිළිබඳ ලියාපදිංචිය සඳහා රීති හා රෙගුලාසි
• විදේශ උපදේශක පරිවයන් පිළිබඳ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රය

5.0 ඉදිකිරීම් විශිෂ්ටත්වය සඳහා සීඩා සම්මාන

ඉදිකිරීම් කර්මාන්තයේ ඍත්තීයභාවය සහ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කෙරෙන 1990 වර්ෂයේ ආරම්භ කරන ලද වාර්ෂික සම්මාන ප්‍රදාන යෝජනා ක්‍රමය අඛණ්ඩව 30 වැනි වරටත් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක විය. මෙම සම්මාන ප්‍රදානයේදී ඉදිකිරීම් කළමනාකරණයේ කැපී පෙනෙන කාර්ය සාධනය, තාක්ෂණික විශේෂඥතාව සහ ගුණාත්මක තත්ත්වයෙහි විශිෂ්ටත්වය, නවෝත්පාදන සහ අදාළ තාක්ෂණය හඳුන්වාදීම සහ ශිල්පීන් පුහුණු කිරීම සඳහා සහභාගීත්වය ආදිය හඳුනා ගනී.

2020 වර්ෂය සඳහා වන ඉහත උත්සවය 2020 දෙසැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කල් දැමීමට සිදු විය. 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කළ යුතුව තිබූ සම්මාන පිළිබඳ අවසන් ඇගයීම් 2020 අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී පවත්වන ලදී. 2020 වර්ෂය සඳහා සම්මානලාභීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2020 සම්මාන ලාභීන්

ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් විශිෂ්ටත්වය සහ ඉදිකිරීම් කුසලතා සඳහා ජාතික සම්මාන

අංකය	ව්‍යාපෘතිය හා ලබන්නා	සම්මාන වර්ගය
01	වෝන්ලන් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ගුණවර්ධන ආයුර්වේද හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ආයුර්වේද රෝහල් ගොඩනැගිල්ල ඉදිකිරීම - අනුරාධපුරය	විශිෂ්ටත්වය

02	සතුට බිල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් කොළඹ 08 හි කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ රොඩ්නි ස්ට්‍රීට් සංවර්ධන ව්‍යාපෘති	විශිෂ්ටත්වය
03	නසීහා හාර්ඩ්වෙයාර් කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙන්තාරුමූලෙයි හි නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම සහ ඉදිකිරීම	කුසලතා
04	ශ්‍රීපාලි කන්ට්‍රැක්ටර්ස් (පිවීටී) ලිමිටඩ් විසින් දෙහිවල කවුන්සිල් පටුමගෙහි ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීම් අංශය 4,කෝපරේට් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම	කුසලතා
05	වී. කරුණාරත්න ඇන්ඩ් කම්පැණි විසින් රාජගිරියේ සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම	කුසලතා

හරිත ඉදිකිරීම් විශිෂ්ටත්වය සඳහා ජාතික සම්මාන

	ව්‍යාපෘතිය හා ලබන්නා	සම්මාන වර්ගය
01	ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටියම් (පිවීටී) ලිමිටඩ් ආයතනය විසින් හෝමාගම හි, මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනය (ITUM) වෙනත් තැනක පිහිටුවීම හා සංවර්ධනය පිළිබඳ සැළසුම් කිරීම හා ඉදිකිරීම	විශිෂ්ටත්වය

සිවිල් ඉංජිනේරු ව්‍යාපෘතිවල ඉදිකිරීම් කාර්ය සාධනය සඳහා ජාතික සම්මාන ප්‍රතිඵල

(දේශීය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් කරන ලද විදේශීය ව්‍යාපෘති සඳහා සම්මාන)

	ව්‍යාපෘතිය හා ලබන්නා	සම්මාන වර්ගය
01	සන්කෙන් ඕවර්සීස් (පිවීටී) ලිමිටඩ් මියන්මාර් තිලාව හි යැන්ග්ඩන් වරාය පුළුල් කිරීම	කාර්ය සාධන සම්මාන

සිවිල් ඉංජිනේරු ව්‍යාපෘතිවල ඉදිකිරීම් කාර්ය සාධනය සඳහා ජාතික සම්මාන ප්‍රතිඵල (ඉදිකිරීම් නවෝත්පාදන ශිල්පීය ක්‍රම සඳහා සම්මාන)

	ව්‍යාපෘතිය හා ලබන්නා	සම්මාන වර්ගය
01	ELS කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ත්‍රිකුණාමලය කෝඩ් බේ වයිනා බේ, හි ටෝකියෝ සිමෙන්ට් ලංකා පීඑල්සී ආයතනය සඳහා පවත්නා ජෙටි පහසුකම වැඩි දියුණු කිරීම.	කාර්ය සාධන සම්මාන

විදුලි හා කාර්මික ව්‍යාපෘතීන් හි ඉදිකිරීම් විශිෂ්ටත්වය සඳහා ජාතික සම්මාන ප්‍රතිඵල

	ව්‍යාපෘතිය හා ලබන්නා	සම්මාන වර්ගය
01	තුඩාවේ ඉන්ජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කම්කරු කොමසාරිස් ජනරාල් සඳහා යෝජිත බහු මහල් කාර්යාල සංකීර්ණය (2015/03/EM-LV)	විශිෂ්ටත්වය
02	තුඩාවේ ඉන්ජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කම්කරු කොමසාරිස් ජනරාල් සඳහා යෝජිත බහු මහල් කාර්යාල සංකීර්ණය (2015/03/EM-LV)	ඇගයීම් සහතිකය

ඉදිකිරීම් කාර්ය සාධනය සඳහා ජාතික සම්මාන - 2020

(සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති)-ප්‍රතිඵල

අංකය	ව්‍යාපෘතිය හා ලබන්නා	සම්මාන වර්ගය
01	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 49 ක් ප්‍රතිසංස්කරණය කිරීම / වැඩිදියුණු කිරීම - කොන්ත්‍රාත් 1 වර්ෂ 3ක් සඳහා කාර්ය සාධන පදනම් නඩත්තුව ඇතුළත්ව, කොන්ත්‍රාත් අංකය RDA/ADB/iROAD (NC)/NCB/CP-RR(PO1) ඇලහැර , තමන්කඩුව - මාගා ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින්	සම්මාන
02	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 83 ක් ප්‍රතිසංස්කරණය කිරීම / වැඩිදියුණු කිරීම - කොන්ත්‍රාත් 1 වර්ෂ 3ක් සඳහා කාර්ය සාධන පදනම් නඩත්තුව ඇතුළත්ව, කොන්ත්‍රාත් අංකය RDA/ADB/iROAD (NC)/NCB/CP-RR(AP1) නාච්චදූව , තලාව, නොච්චියාගම, විලච්චිය, නුවරගම්පළාත - මාගා ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින්	සම්මාන
03	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 77 ක් ප්‍රතිසංස්කරණය කිරීම / වැඩිදියුණු කිරීම - කොන්ත්‍රාත් 2 වර්ෂ 3ක් සඳහා කාර්ය සාධන පදනම් නඩත්තුව ඇතුළත්ව, කොන්ත්‍රාත් අංකය RDA/ADB/iROAD (NC)/NCB/CP-RR(AP2) - කැකිරාව, පලාගල්ල, ගල්නැව, ඉප්ලෝගම, රාජාංගනය, තඹුත්තේගම - මාගා ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින්	සම්මාන
04	බදුල්ල, හාලිඇල සහ ඇල්ල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම - WTP සහ DAM ඉදිකිරීම - හාලිඇල ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටියම් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින්	සම්මාන

05	කොව්විකඩේ පාලම ප්‍රතිසංස්කරණය කිරීම - පැලියගොඩ - පුත්තලම් මාර්ගයේ (A – 003) පාලම් අංක 38/3 - ඇක්සෙස් ඉන්ජිනියරින් පිඑල්සී සමාගම විසින්	සම්මාන
06	මහනුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම - කොන්ත්‍රාත් 3 (KA 3) මහනුවර දිස්ත්‍රික්කය එඩිවර්ඩ් ඇන්ඩ් ක්‍රිස්ටි විසින්	සම්මාන
07	නාරම්මල - දන්කොටුව මාර්ගයේ කි.මී. 16+030 සිට 45+250 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම - නාරම්මල - NEM කන්ස්ට්‍රක්ෂන්(පිවිටී) ලිමිටඩ් සමාගම විසින්	සම්මාන
08	අකුරේගොඩ, බත්තරමුල්ල ආරක්ෂක මූලස්ථාන ව්‍යාපෘතිය සංවර්ධනය සම්බන්ධිත මාර්ග ජාලය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම, අකුරේගොඩ මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්.	සම්මාන
09	ඇලහැර - ගිරිතලේ මාර්ගය වැඩි දියුණු කිරීම (Ch. 0+000 සිට කි.මී.29+000 දක්වා) කන්සල්ටින් ඉන්ජිනියරින් ඇන්ඩ් කන්ට්‍රැක්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්.	සම්මාන
10	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 85ක් ප්‍රතිසංස්කරණය කිරීම / වැඩිදියුණු කිරීම – කොන්ත්‍රාත් 1 වර්ෂ 3ක් සඳහා කාර්ය සාධනය පදනම් නඩත්තුව ඇතුළත්ව, කොන්ත්‍රාත් අංකය RDA/ADB/iROAD (NW)/NCB/CP-RR(KU1) බිංගිරිය , උඩබද්දාව, පඩුවස්නුවර බටහිර / නැගෙනහිර, කුලියාපිටිය නැගෙනහිර - මාගා ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින්	සම්මාන
11	දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිට මාදුරුගොඩ දක්වා B 157 (නැගෙනහිර) මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීම / වැඩිදියුණු කිරීම – (කි.මී.42+372 සිට කි.මී.32 + 000 දක්වා) වර්ෂ 5ක කාර්ය සාධන නඩත්තුව ඇතුලත්ව කොන්ත්‍රාත් අංක RDA/SRCP/ICB/ADB/CP-03 වැලිපැන්න සිට මතුගමට - මාගා ඉන්ජිනියරින් (පිවිටී) ලිමිටඩ් සමාගම විසින්	සම්මාන

6.0 සිඩා තොරතුරු තාක්ෂණ පද්ධතිය

පහත සඳහන් වැදගත් ක්‍රියාකාරකම් තොරතුරු තාක්ෂණ යටිතල සඳහා එක් කිරීමට හඳුනාගෙන ඇත.

අ. 2019/2020 වර්ෂ තුළදී පහත සඳහන් ක්‍රියාකාරකම් අවසන් කර ඇත.

1) සුදුසු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය

2) ගෙවීම් පිවිසුම් මහ ඒකාබද්ධ කිරීම

3) වෙබ් අඩවි වැඩි දියුණු කිරීම

4) ලියකියවිලි කළමනාකරණ පද්ධතිය

ආ.පහත සඳහන් ප්‍රසම්පාදන කටයුතු / සංවර්ධන වැඩ වර්ෂය තුළ කෙරෙමින් පවතී.

1) දේපල සංවර්ධන ලියාපදිංචි පද්ධතිය

2) විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය

3) ඉදිකිරීම් ද්‍රව්‍ය සහ සංරචක ආනයනකරුවන්, නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය

4) හඳුනාගත් ඉදිකිරීම් වැඩ පිළිබඳ තොරතුරු පද්ධතිය

5) තත්ත්ව කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය

6) ද්‍රව්‍ය පිරිවැය ගණනය කිරීමේ පද්ධතිය

7) විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය

8) ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලියාපදිංචි කිරීමේ පද්ධතිය

7.0 2020 වසරේ පවත්වන ලද සම්මන්ත්‍රණ / සම්මන්ත්‍රණ / වැඩමුළු

මෙම වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.

මධ්‍ය හා අඩු වෝල්ටීයතාවය සවිකිරීම් පිළිබඳ සැලසුම් කිරීම - පෙබරවාරි 12

මෙම සම්මන්ත්‍රණය/වැඩමුළුව පැවැත්වීමේ අරමුණ වනුයේ ඉදිකිරීම් කර්මාන්තයේ විදුලිබල හා යාන්ත්‍රික අංශයන්ට අදාළ තොරතුරු ව්‍යාප්ත කිරීම හා ආදායම් උත්පාදනයයි.

<u>විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය</u>

ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී ඒකකය



දැක්ම :

"ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින සියලුම පුහුණුකරුවන් සහ සේවාදායකයින් සඳහා ප්‍රමුඛ සේවාවන් ලබාදීමට කැපවුණු ශක්තිය තුළින් සහ ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය නිපුණ ශ්‍රම බලකායක් සැපයීම මඟින් වඩාත් ප්‍රමුඛතාවයකින් යුතු රාජ්‍ය සංවිධානය බවට පත්වීම"

මෙහෙවර :

"ඉදිකිරීම් කර්මාන්තයේ කුසලතා බෙදාදීම සහ මෙහෙයුම් කටයුතු ලෙස දැනුම, නඩත්තුව සහ ඉදිකිරීම් උපකරණ කළමනාකරණය තුළින් දක්ෂ ශ්‍රම බලකායක් ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ බිහිකිරීම සහ එමඟින් ඉදිකිරීම් නිෂ්පාදන ඵලදායීතාවයේ මැනිය හැකි වර්ධනයක් ලබාගැනීම"

අරමුණු :

- ස්ථාපිත ජාතික නිපුණතා ප්‍රමිතීන් සඳහා ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීම.
- යන්ත්‍ර හා අධීක්ෂණ කළමනාකරණය පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම.
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා ජාතික වෘත්තීය පරීක්ෂණ හා **NVQ** පරීක්ෂණ පැවැත්වීම.
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් හට තම කාර්යය කාර්යක්ෂමව හා ඵලදායීතාවයෙන් යුතුව ඉටු කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම.



- ඉදිකිරීම් කර්මාන්ත සඳහා යන්ත්‍ර හා උපකරණ කුලියට දීම.
- රාජ්‍ය ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි පාර්ශවකරුවකු වශයෙන් නවක ක්‍රියාකරුවන්ට අත්දැකීම් ලබාගැනීම මෙන්ම ජාතික සංවර්ධනයට දායක වීම.

හැඳින්වීම

ක්‍රෝලර් ට්‍රැක්ටර්ස්, ලෝඩර්ස්, එක්ස්සවේටර්, මෝටර් ග්‍රේඩර්ස් වැනි ඉදිකිරීම් උපකරණවල ආරක්ෂාව, මූලික නඩත්තුව සහ මෙහෙයුම් තාක්ෂණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විදුහල පුහුණුව ලබා දෙයි. ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විදුහල සතුව ඉදිකිරීම් උපකරණ 63 ක පද්ධතියක් සහ පුහුණු නිළධාරීන් හා ප්‍රදර්ශක නිළධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇත.

පුහුණුවන්නන් සඳහා කුසලතා ලබාදීම සඳහා පුහුණු කාලයෙන් 70 % ක් පමණ ප්‍රායෝගික පුහුණුව සඳහා වෙන්කර ඇති අතර ඉතිරි 30% න්‍යායාත්මක කරුණු සඳහා සීමාවේ. පුහුණුවන්නන් සඳහා රැකියා පුහුණුව ලබාදෙන අතරම ආදායම් උත්පාදනය සඳහා සමහර ඉදිකිරීම් උපකරණ කුලියට දෙනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද ආකාරයට මෙහෙයුම් ශිල්පි විදුහලේ පුහුණු වැඩසටහන් ආයතනික පුහුණුවෙන් හා ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක වන විට රැකියා පුහුණුවෙන් සමන්විත වේ. ආයතනික පුහුණුව අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් මාස 03 ක කාලයක් රැකියා පුහුණුව ලබා ගන්නා අභ්‍යාසලාභියෙකු NVQ සඳහා සුදුසුකම් ලබයි. ඉදිකිරීම් උපකරණ ශිල්පීන්ට NVQ පරීක්ෂණ පහසුකම් සැපයීම සඳහා NAITA විසින් මෙහෙයුම් ශිල්පි විදුහල (OTC) පිළිගෙන ඇත.

පහත සඳහන් පුහුණු පාඨමාලා වර්තමානයේදී ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විදුහලේ පවත්වනු ලැබේ.

1. ප්‍රාථමික පුහුණුව

1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තු ශිල්පය

2. කුසලතා සංවර්ධනය

2.1 සැහැල්ලු ඉදිකිරීම් උපකරණ

2.2 ඩම්ප් ට්‍රක්

2.3 ෆාම් ට්‍රැක්ටර්

2.4 සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් වයිබ්‍රේටින් රෝලර්

3. පස් ඉවත් කරන උපකරණ මූලික මොඩියුල

3.1 ක්‍රෝලර් ට්‍රැක්ටර්

3.2 වීල් ලෝඩර්

3.3 මෝටර් ග්‍රේඩර්

3.4 හයිඩ්‍රොලික් එක්ස්කවේටර්

3.5 බැක්හෝ ලෝඩර්

3.6 ස්කිඩ් ස්ටියර් ලෝඩර්

4. විශේෂිත උපකරණ

4.1 මොබයිල් ක්‍රේන්

4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝටර්

4.3 ෆෝක් ලිෆ්ට් ට්‍රක්

4.3 ෆෝක් ලිෆ්ට් ට්‍රක්

4.4 ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන්

5. වෘත්තීය පරීක්ෂණ

5.1 NVQ පරීක්ෂණ

6. අභිමතකරණ පුහුණු වැඩසටහන්

ලංකා විදුලිබල මණ්ඩලය සඳහා ට්‍රක් සවිකර ඇති දොඹකර සහ Auger Truck විශේෂිත පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

සියලුම ප්‍රධාන ඉදිකිරීම් උපකරණ වර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා 2020 වසරේ පවත්වන ලදී.

7. සම්මන්ත්‍රණ / වැඩමුළු

ඉදිකිරීම් කර්මාන්තයේ ඉල්ලුම මත ඉදිකිරීම් උපකරණ කළමනාකරණය සහ අධීක්ෂණ වැඩසටහන් සහ නිපුණතා පරීක්ෂණ, ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විදුහල විසින් පවත්වන ලදී. විශේෂිත දැනුවත් කිරීමේ වැඩසටහන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහයකයින් සඳහා පවත්වන ලදී.

පුහුණු නිම කිරීම - 2020

ඉදිකිරීම් උපකරණ ශිල්පීන් ලෙස ශිල්පීන් 678 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කරන ලද නමුත්, කොවිඩ් - 19 වසංගත තත්ත්වය මෙහෙයුම් ශිල්පි වැඩසටහන් පැවැත්වීම සඳහා තදබල ලෙස බලපාන ලදී. ඉදිකිරීම් උපකරණ ශිල්පීන් පුහුණුව ක්ෂේත්‍රයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මත පදනම් වන බැවින් මාර්ගගත ක්‍රමයට පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. 2020 වර්ෂය සඳහා ඉලක්කගත පුහුණු නිම කිරීම් හා එක් එක් පුහුණු වැඩසටහනේ ඉටුකර ගැනීම් පහත වගුවෙන් දැක්වේ. (1 වගුව බලන්න)

වගුව I :- පුහුණු නිම කිරීම - 2020

පුහුණු වැඩසටහන	නිමැවුම - 2020	
	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගීත්ව සංඛ්‍යාව
1.0 ප්‍රාථමික පුහුණුව		
1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම	10	223
2.0 කුසලතා සංවර්ධනය		
2.1 සැහැල්ලු උපකරණ	-	-
2.2 ට්‍රැක්ටර්	03	14
2.3 සේල්ෆ් ප්‍රොපෙල්ඩ් රෝලර්	01	02
2.4 ඩම්ප් ට්‍රක්	-	-
3.0 පස් ඉවත් කිරීමේ උපකරණ මූලික මොඩියුල		
3.1 ක්‍රෝලර් ට්‍රැක්ටර්	-	-
3.2 වීල් ලෝඩර්	02	10

3.3 මෝටර් ග්‍රේඩර්	02	15
3.4 හයිඩ්‍රොලික් එක්ස්කවේටර්	03	31
3.5 බැක්හෝ ලෝඩර්	04	29
3.6 ස්කිඩ් ස්ටියර් ලෝඩර්	-	-
4.0 විශේෂිත උපකරණ		
4.1 මොබයිල් ක්‍රේන්	04	22
4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝමර්	03	18
4.3 ෆෝක් ලිෆ්ට් ඔපරේටර්	02	8
4.4 ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන්	10	52
අභිමතකරණ වැඩසටහන්	03	50
එකතුව	**47**	**474**

<u>පුහුණු යටිතල පහසුකම් සංවර්ධනය</u>

Pax 200 දෙනෙකුගේ ධාරිතාවයකින් යුත් නව දේශන ශාලාවක් ඉදිකිරීම.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සවිබල ගැන්වීමක් සමඟ ඉදිකිරීම් කර්මාන්තයේ වඩාත් පුළුල් වගකීම් මෙහෙයුම් ශිල්පී විදුහල (OTC) සතුවේ. එබැවින් පාර්ශවකරුවන් සඳහා වැඩි සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට 2019 වර්ෂයේ නව දේශන ශාලාවක් ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර 2020 වර්ෂයේදී එය සම්පූර්ණ කරන ලදී.

එහි ඉදිකිරීම් අදියරේදී නව නවාතැන් පහසුකම්ද සම්පූර්ණ කරන ලද සංවර්ධන වැඩසටහන් සඳහා දායක වන සම්පත්දායකයන් සඳහා නිසි පහසුකම් මෙහෙයුම් ශිල්පී විදුහලෙහි (OTC) ලැබෙනු ඇත.

<u>ඉදිකිරීම් උපකරණ කුලියට දීම</u>

ඉදිකිරීම් උපකරණ කුලියට දීම මෙහෙයුම් ශිල්පී විදුහල (OTC) විසින් සපයන ලද අතිරේක සේවාවකි. විදුහල සඳහා වැඩි ආදායමක් ද එමඟින් උත්පාදනය කෙරේ. පවත්නා යන්ත්‍ර ඇණිය භාවිතා කිරීමේ පළමු ප්‍රමුඛතාවය පුහුණුව වන අතර, යන්ත්‍ර නිශ්කාර්යව පවතින අවස්ථා වලදී කුලියට දෙනු ලැබේ. පුහුණු වැඩසටහන් නතර වීම හේතුවෙන් උපකරණ කුලියට දීම වැඩි විය. එබැවින් පුහුණු වැඩසටහන් ආරම්භ කෙරෙන තෙක් වසංගත තත්ත්වයේ 2 වන වැඩිවීමේදී උපකරණ කුලියට දීම වර්ධනය වී ඇත.

<u>ඉදිකිරීම් ව්‍යාපෘති.</u>

වීරවිල විවෘත බන්ධනාගාර වැඩ කඳවුරෙහි අක්කර 150 ක් වන ඉඩම සඳහා අභ්‍යන්තර මාර්ගය ඉදිකිරීම, වීරවිල ස්ථාපිත එහි උප මධ්‍යස්ථානය යොදා ගනිමින් මෙහෙයුම් ශිල්පී විදුහල විසින් සිදු කරන ලදී. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවන් ඉටුකරමින් ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කරන ලදී. පුහුණු සහ ව්‍යාපෘති මෙහෙයවීම සඳහා එහි ධාරිතාවය සම්පූර්ණ කරමින් වීරවිල මෙහෙයුම් ශිල්පී විදුහල විසින් පවත්වන ලද පළමු ඉදිකිරීම් ව්‍යාපෘතිය මෙය විය.

2020 වර්ෂය තුල මෙහෙයුම් ශිල්පි විදුහලේ ආදායම

වගුව - 2

කාර්ය වර්ගය	ආදායම (රු.)
පුහුණු වැඩසටහන් (ගල්කුලම)	6,581,000.00
යන්ත්‍රෝපකරණ කුලියට දීම ඉදිකිරීම් ව්‍යාපෘතිය (වීරවිල)	6,013,000.00 621,132.00
NVQ පරීක්ෂණ	-
අභිමතකරණ පුහුණු	770,000.00
මෙහෙයුම්කරුවන්ගේ හඳුනාගැනීම් පත්‍ර	120,000.00
විවිධ	
එකතුව	14,105,132.00

1.0 ඉදිකිරීම් උපකරණ නඩත්තු පුහුණු ඒකකය

ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශයේ ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ කළමනාකරණ පුහුණු ඒකකය, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), බත්තරමුල්ල, පැලවත්ත, ඩී.පී. විජේසිංහ මාවත අංක 17, යන ස්ථානයේ පිහිටා ඇත. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) අලුත්වැඩියා නඩත්තු හා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා මනාව සම්පාදනය කරන ලද ස්ථානයකි. ව්‍යාපෘති සහ නඩත්තු කළමණාකරුවන්, යාන්ත්‍රික ඉංජිනේරුවන්, වැඩපොළ අධිකාරීවරුන්, වැඩපොළ අධීක්ෂකයින්, ජ්‍යෙෂ්ඨ කාර්මිකයින්, යන්ත්‍ර උදව්කරුවන් සහ පාසල් හැර යන්නන් සඳහා පුහුණු පාඨමාලා මෙම CETRAC මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබේ.



1.1 ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) පුහුණු වැඩසටහන්

1996 ඔක්තෝබර් සිට 2001 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළදී ජපන් විශේෂඥයින්ගේ සහාය සහිතව ඉදිකිරීම් උපකරණ නඩත්තුව සඳහා CETRAC පුහුණු වැඩසටහන් ආරම්භකව සංවර්ධනය කරන ලදී. CETRAC විසින් මූලිකව ඉදිකිරීම් උපකරණ නඩත්තුව හා කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබා දෙයි. සිඩා විසින් ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන්ද CETRAC හි පැවැත්වීම සඳහා ආරම්භ කර ඇත.

1.2 කර්මාන්තයට නවකයින් සඳහා පාඨමාලා

යොවුන් විරැකියාව පිළිබඳ ගැටලුව නිරාකරණය කිරීම සඳහා මුල් පාසල් හැර ගිය අයවලුන් සඳහා වෘත්තීය පාඨමාලා වැඩි වශයෙන් සංවර්ධනය කිරීමට හා පැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව 2020 වර්ෂයේදී පහත සඳහන් පාඨමාලා පවත්වන ලදී.

1.3 ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලාව

ඉදිකිරීම් උපකරණ කාර්මික පුහුණු පාඨමාලාව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ සහයෝගීත්වයෙන් සිදු වේ. එය වර්ෂ 02 ක පාඨමාලාවක් වන අතර එය CETRAC හි මාස 12 ක ආයතනික පුහුණුවකින් සහ කර්මාන්තයේ මාස 12 ක රැකියා පුහුණුවකින් සමන්විත වේ. අ.පො.ස. (සා/පෙළ) සහිත පාසල් හැර යන්නන් මෙම පුහුණු පාඨමාලාව සඳහා සුදුසුකම් ලබයි. මෙම පුහුණු පාඨමාලාවෙන් නව ඉදිකිරීම් උපකරණ පිළිබඳ සියලුම අලුත්වැඩියා හා නඩත්තු අංශ ආවරණය කෙරේ. වාර්ෂික බඳවාගැනීම පුහුණුවන්නන් 120 සඳහා වේ.

පුහුණුවන කාල පරිච්ඡේදය තුලදී නොමිලේ නවාතැන්, පාඨමාලා ද්‍රව්‍ය, වැඩමුළු පහසුකම්, නිල ඇඳුම් සහන මිලට ආහාර සහ ආරක්ෂිත ආම්පන්න ආදිය මෙම පුහුණුවන්නන්ට ලබාදෙනු ලැබේ. මෙම වැඩසටහනේ පෙර සිටි අභ්‍යාසලාභීන් සියලු දෙනාම පාහේ දේශීයව මෙන්ම විදේශන්හිද වාසිදායක අයුරින් සේවය කරනු ලැබේ. ඔවුන්ගෙන් සමහරක් ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා තමන්ගේම වැඩපොළවල් පිහිටුවා ඇත.

මෙම වැඩසටහන සාර්ථකව නිමකළ අභ්‍යාසලාභීන්ට NVQ- 4 මට්ටමේ සහතිකය ප්‍රදානය කෙරේ.

සේවක නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා කළමනාකරණය කිරීමේ යෙදී සිටින කාර්මිකයින්, අධීක්ෂකයින් හා කළමණාකරුවන්ගේ තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා සැලසුම් කර ඇත. එක් එක් අභ්‍යාසලාභියා සඳහා පුද්ගලික අවධානය යොමු කිරීමේ අරමුණින් අභ්‍යාසලාභීන් බඳවාගැනීම එක් කාණ්ඩයකට 12 බැගින් සීමා වේ. මෙම පාඨමාලා හැදෑරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රමාණවත් පළපුරුද්දක් අවශ්‍ය වේ.

1.4 කණිෂ්ඨ කාර්මිකයින් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීමේ වැඩපොළවල සේවයේ යෙදී සිටින කණිෂ්ඨ කාර්මිකයින්ගේ දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන් සැලසුම් කරන ලදී. මෙම පාඨමාලා හැදෑරීම

සඳහා වර්ෂ 02 සිට 05 දක්වා පළපුරුද්දක් අවශ්‍ය වේ. සේවායෝජකයින් තම පුහුණු අවශ්‍යතා මත ඔවුන්ගේ කාර්මිකයන් ඕනෑම මොඩියුලයකට එවිය හැකි වන ලෙස මෙම පාඨමාලා විවිධ මොඩියුලවලට බෙදා වෙන් කර ඇත. හයිඩ්‍රොලික්ස් සහ මෙකාට්‍රොනික්ස් වැනි මෙම මොඩියුල වලින් ඇතැම් මොඩියුල සඳහා කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවතී. එබැවින් මෙම මොඩියුල සඳහා සමහර විට අතිරේක පාඨමාලා පැවැත්විය යුතු වේ.

ජ්‍යෘෂ්ඨ කාර්මිකයින් සඳහා පුහුණු වැඩසටහන්

ජ්‍යෘෂ්ඨ කාර්මිකයින්ගේ දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම සහ වැරදි හඳුනාගැනීම හා නිවැරදි කිරීම පිළිබඳව ඔවුන් පුහුණු කිරීම සඳහා මෙම උසස් පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. වර්ෂ 05 කට වඩා පළපුරුද්දක් ඇති කාර්මිකයින් මෙම පාඨමාලාව සඳහා සහභාගිවීමට සුදුසුකම් ලබයි. සේවායෝජකයන් ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා අනුව, ඕනෑම තෝරාගත් මොඩියුලයකට තම කාර්මිකයින් යැවීමට හැකිවන පරිදි මෙම පුහුණු පාඨමාලා විවිධ මොඩියුල 6 කින් සමන්විත වේ . හයිඩ්‍රොලික්ස් සහ මෙකාට්‍රොනික්ස් වැනි මෙම මොඩියුල වලින් ඇතැම් මොඩියුල සඳහා කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවතින අතර එබැවින් මෙම මොඩියුල සඳහා සමහර විට අතිරේක පාඨමාලා පැවැත්විය යුතු වේ.

අධීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම සඳහා වගකිව යුතුවන වැඩපොළ





අධීක්ෂකවරුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා අධීක්ෂක පුහුණු වැඩසටහන් නිර්මාණය කර ඇත. වර්ෂ 02 ක අදාළ පළපුරුද්ද සහිත අධීක්ෂකවරුන් මෙම පාඨමාලා සඳහා බඳවා ගැනේ.

ඉංජිනේරුවරුන් / කළමණාකරුවන් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම සඳහා සම්බන්ධවන ඉංජිනේරුවන්, වැඩපොළ කළමණාකරුවන් හා ව්‍යාපෘති කළමණාකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම පිළිබඳ සිවිල් ඉංජිනේරුවන් හා ව්‍යාපෘති කළමණාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා ඉදිකිරීම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව නිර්මාණය කර ඇත. වසර 02 ක පළපුරුද්දක් තිබෙන ඉංජිනේරුවන් මෙම පාඨමාලාව සඳහා බඳවාගැනීම සිදු කරයි.

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම් පිළිබඳ පුහුණු පාඨමාලාව, ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු යාන්ත්‍රික ඉංජිනේරුවන්ට සහ ඉදිරිපෙළ කළමණාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා සහභාගීවන්නන්ට වසර 02 ක පළපුරුද්දක් තිබිය යුතුය.





1.5 සහායක කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්

සාමාන්‍යයෙන් ඉදිකිරීම් කර්මාන්තයේ සේවය කරන ගබඩා/ සැපයුම්/ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ක්‍රමානුකූල පුහුණුවක් සඳහා අවස්ථාවක් නොමැත. මෙය උපකරණ අලුත්වැඩියා කිරීමේ වෙළඳසැල්වල සුමට ක්‍රියාකාරීත්වයට බාධාවක් වන විවිධ මෙහෙයුම් ගැටලු වලට තුඩු දී ඇත. මෙම පුහුණු අවශ්‍යතාවය සපුරාලීම සඳහා පුහුණු වැඩසටහන් සකස් කරන ලදී.

1.6 ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන්

ගොඩනැගිලි සේවා ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා වැඩසටහන් කිහිපයක් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නඩත්තු පුහුණු මධ්‍යස්ථානය CETRAC විසින් පවත්වනු ලැබේ.

වාණිජ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන මෙම ගොඩනැගිලි සේවා ආවරණය කිරීම සඳහා පුහුණු පාඨමාලා කිහිපයක් නිර්මාණය කර ඇත. ඒවා ගිනි ආරක්ෂණ පද්ධති, විදුලි පද්ධති, වායු සමීකරණ සහ වාතාශ්‍ර පද්ධති, ජල සම්පාදන පද්ධති හා ජල ප්‍රවාහන පද්ධති ආදිය ආවරණය කරයි.

1.7 පාරිභෝගිකයන් අරමුණු කරගත් පුහුණු වැඩසටහන්

ලබාගත් අත්දැකීම් සමඟ රටේ වෙනස්වන ඉල්ලුමට සරිලන පරිදි අභිමතකරණය කරන ලද පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීමෙන් පුහුණුවීම්වල විවිධ සහ විශේෂිත ඉල්ලුම සාර්ථකව සපුරාලීමට ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු නඩත්තු මධ්‍යස්ථානයට (CETRAC) හැකි වී තිබේ.

2020 වර්ෂයෙහි CETRAC හි කාර්ය සාධනය පහත පරිදි වේ.

වගුව 1 : 2020 වර්ෂයේ CETRAC කාර්ය සාධනය

පුහුණු පාඨමාලා	ලියාපදිංචි වූ		සමත් වූ	
	පාඨමාලා සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	පාඨමාලා සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
01. පාසල් හැරයන්නන් (මට්ටම 1) ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලාව (CFM)	2	120	2	125
02. ඉදිකිරීම් නඩත්තු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (NVQ- 5)	1	30	1	7
පුහුණු පාඨමාලා	**පාඨමාලා සංඛ්‍යාව**	**සහභාගී වූ සංඛ්‍යාව**	**පාඨමාලා සංඛ්‍යාව**	**සහභාගී වූ සංඛ්‍යාව**
03. කණිෂ්ඨ කාර්මිකයින්				
හයිඩ්‍රොලික් පද්ධතිය නඩත්තු කිරීම (20M22)	1	15	1	7
ජල පොම්ප හා කම්ප්‍රේෂර් නඩත්තු කිරීම (20WPC)	1	15	1	19
04. සහායක කාර්ය මණ්ඩලය				
සහායක කාර්ය මණ්ඩලය සඳහා ගබඩා තබාගැනීම, සැපයුම් දාමය සහ ගබඩා කළමනාකරණය සඳහා මූලික පාඨමාලාව	1	10	1	38
ගබඩා තබාගැනීම, සැපයුම් දාමය සහ සැපයුම් කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	1	10	1	24
ආයතනයේ සුළු කාර්ය මණ්ඩලයට රාජකාරි, ආගන්තුක සත්කාරය සහ ආචාරධර්ම සම්බන්ධතා පිළිබඳ එක් දින වැඩමුළුව	2	40	1	54

ආයතනයක තත්ත්ව කළමනාකරණ පද්ධති සංකල්ප යොදාගැනීම	1	25	1	15
05. අභිමත සැලසුම් පාඨමාලා (CET)				
පෝරක් ලිෆ්ට් ක්‍රියාකරු පුහුණුව (දින 03)	1	15	1	3
පෝරක් ලිෆ්ට් ක්‍රියාකරු පුහුණුව (දින 05)	1	25	2	6
සන්නිවේදන කුළුණු හසුරුවන්නා හා සාමාන්‍ය හසුරුවන්නා	1	25	1	6
06. අභිමත පාඨමාලා සැලසුම් (BSI)				
සක්‍රීය හා උදාසීන ගිනි ආරක්ෂණ පද්ධති	1	20	1	25
වායු සමීකරණ පද්ධති හා ගොඩනැගිලි සඳහා යෙදවුම්	1	20	1	36
උස් ගොඩනැගිලි සඳහා ජලනල පද්ධති	1	20	1	44
අප ජලය එකතු වීම පිලියම්, අපහරණ මාර්ග හා වැසි ජල අපහරණ පද්ධති	1	15	1	11
ප්‍රවේශ පාලන පද්ධති	1	20	1	25
ස්පිලිට් වර්ගයේ වායු සමීකරණ ඒකක පිළිබඳ විශේෂ කාර්ය පුහුණු වැඩසටහන	1	25	1	12
වැසි ජල අස්වනු	1	25	1	20
ඔසවන උපාංග සඳහා ආරක්ෂාකාරී භාවිතය	1	40	1	54
සෝපාන හා විද්‍යුත් පඩිපෙල නඩත්තු කිරීම	1	25	1	21
07. වැඩමුළු හා සම්මන්ත්‍රණ				
සේවකයන් තෝරාගැනීම හා පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම	1	50	1	22
එක්දින වැඩමුළුව				
මූලික පරිගණක වැඩසටහන්	1	100	1	32
එක්දින වැඩමුළුව ආරක්ෂාකාරී	1	50	1	32
විද්‍යාත්මක හා ආර්ථිකමය				
ආරක්ෂාකාරී, විද්‍යාත්මක හා ආර්ථිකමය රිය පැදවීම	1	100	2	140

රියදුරු පුහුණුව පිළිබඳ එක් දින වැඩමුළුව	1	100	1	87
රියදුරු පුහුණුව	1	80	1	36
මාර්ග සැලසුම් කිරීම, ඉදිකිරීම හා නඩත්තුව	1	100	1	100
එකතුව	**29**	**1135**	**29**	**1021**

2020 වර්ෂය සඳහා උපයාගත් ආදායම

රැකියා කාණ්ඩය	**ආදායම** **රු. මිලියන**
පුහුණු වැඩසටහන් වැඩ මුළු හා සම්මන්ත්‍රණ	9.523
වැඩපොළ අලුත්වැඩියා කිරීමේ කාර්යයන් සහ වෙනත් වැඩපොළ සේවා	1.638
පහසුකම් කුලියට දීම	1.968
එකතුව	**13.129**

කර්මාන්ත පුහුණු අංශය

පෙර නොවූ විරූ හා අසමසම වර්ධන වේගයක් වාර්තා කරමින් සිටින ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධන වේගය පවත්වා ගැනීම සඳහා පුහුණු මානව සම්පත් ඇති බව සහතික කරමින් ඉදිකිරීම් කර්මාන්තයේ සියලුම පාර්ශවකරුවන්ගේ හැකියාවන් ගොඩනැගීම සඳහා කර්මාන්ත පුහුණු අංශය කැපවී සිටී.

ඉදිකිරීම් කර්මාන්තය වර්තමානය වන විට නිපුණ ශ්‍රම හිඟයක් අත්විඳිමින් සිටින අතර මෙම නැගී එන දැවැන්ත වර්ධනය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කරයි.

ඉදිකිරීම් කර්මාන්තයේ ශ්‍රම බලකායේ ධාරිතා වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් නියෝජනය වන පුහුණු අංශය කැප වී ඇත්තේ කර්මාන්තයේ මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා ය.

2020 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

❖ **ඉදිකිරීම් අංශයේ නිපුණතා සංවර්ධනය [5000 අත්කම් ශිල්ප වැඩසටහන]**

පෙදරේරු, වඩු කාර්මිකයන්, ජලනල කාර්මිකයන්, ටයිල් අතුරන්නන් යනාදී ශිල්පීන්ගේ විශාල හිඟයක් පවතින අතර ඉදිකිරීම් ව්‍යාපෘති නියමිත කාල රාමු තුළ උසස් තත්ත්වයේ ප්‍රමිතීන් පවත්වා ගනිමින් නිසි ලෙස නිම කිරීම සඳහා එය අභිතකර ලෙස බලපායි.

ඉදිකිරීම් කර්මාන්තය වර්තමානයේ මුහුණ දෙන මෙම තත්ත්වය, කෙටිම කාලසීමාවක් තුළ වර්තමාන හිඟය සපුරාලීම සඳහා කෙටි පුහුණු වැඩසටහන් වල අවශ්‍යතාවය තවදුරටත් තහවුරු කරයි.

ඉදිකිරීම් කර්මාන්තයේ මෙම ගැටළුව විසඳීම සඳහා NAITA,NCASL හා MCASL සමඟ සහයෝගිත්වයෙන් රැකියා පුහුණු වැඩසටහන කෙටිකාලීනව ක්‍රියාත්මක කිරීමේදී සිඩා (CIDA) විසින් ඉදිකිරීම් කර්මාන්තයේ ඉහළම ආයතනය වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

ඉහත කී වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පෙදරේරු, වඩු කර්මාන්තය, ටයිල් කිරීම, බාර් නැමීම සහ ජලනල වැඩ යනාදී කර්මාන්ත වල 5000 ක් පමණ ශිල්පීන් පුහුණු කිරීම සිදු කර ඇත. අභ්‍යාසලාභීන්ගේ අභිප්‍රේරණය ඇති කිරීම සඳහා පුහුණුවීම් කාලය තුළ ඔවුන්ගේ දෛනික වියදම් පියවා ගැනීමට මසකට රු. 10,000 බැගින් මාස 3 ක කාලයක් සඳහා දීමනාවක්ද සුදුසු ඇඳුම් පැළඳුම් සහිතව ස්වයං රැකියා සඳහා ව්‍යවසායකත්ව වවුචරයක්ද ලබාදෙන ලදී.

❖ **කොන්ත්‍රාත් කළමනාකරණය සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව**

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන කළමනාකරණය කටයුතුවල නියැලී සිටින කළමනාකරණ සහ අධීක්ෂණ මට්ටමේ කාර්ය මණ්ඩලයේ කළමනාකරණ දැනුම සහ හැකියාවන් වැඩි දියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා සිඩා වාර්ෂික කොන්ත්‍රාත් කළමනාකරණ හා ප්‍රසම්පාදන කළමනාකරණ පිළිබඳ සති 40 ක පුහුණු වැඩසටහනක් සංවිධානය කරයි. 2020 වර්ෂය සඳහා වන වැඩසටහන 2020 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල 39 දෙනෙකුගේ සහභාගීත්වය සහිතව පවත්වන ලදී.

❖ **කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ගේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු අංශය විසින් වාර්ෂිකව "කොන්ත්‍රාත් කළමනාකරණ සහතික පාඨමාලාව" පිළිබඳ පුහුණු වැඩසටහන් වාර්ෂිකව

සංවිධානය කරනු ලැබේ. මෙම වැඩසටහන සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. 2020 වර්ෂයේදී වැඩසටහන් 5 ක් පවත්වන ලද අතර කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් 209 දෙනෙකු ඔවුන්ගේ කොන්ත්‍රාත් කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ ධාරිතාවය වැඩි දියුණු කරමින් පුහුණු කරන ලදී.

❖ **ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍යය (CSOH)**

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය අවසාන ප්‍රතිඵලයේ ගුණාත්මකභාවය හා ඵලදායිතාව වර්ධනය කිරීම සහිතව ක්‍රමයෙන් නවීකරණය වෙමින් හා සංකීර්ණ ඉදිකිරීම් ශිල්පීය ක්‍රම හා ක්‍රමවේදයන් කරා ගමන් කරයි. ජීවිතවලට හා දේපළවලට හානි සිදුවන වැඩ ආශ්‍රිත අනතුරු අවම කිරීම සඳහා වැඩබිම් ඉදිකිරීම් ආශ්‍රිත ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍යය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය බව වටහාගෙන ඇත.

කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සෞඛ්‍ය අංශය සමඟ සහයෝගිත්වයෙන් සිඩා විසින් පහත සඳහන් මට්ටම් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් සකස් කර ඇත.

- **ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DS&OH)**

මෙම සති පනස් දෙකක පුහුණු වැඩසටහන, ඉදිකිරීම් වැඩබිම්වල උසස්ම සෞඛ්‍ය හා ආරක්ෂණ භාවිතයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිසි දැනුමක් හා පුහුණුවක් ලබා දෙමින් අධීක්ෂණ මට්ටමේ සේවකයින් ඉලක්ක කර ගනිමින් සතියකට දින දෙකක් ලෙස පවත්වන ලදී. 2020 වර්ෂයේ දී මෙම වැඩසටහන සඳහා 23 දෙනෙකු සහභාගී විය.

- **ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CS&OH)**

පුහුණු අංශය විසින් ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා දෙකක් වාර්ෂිකව සංවිධානය කරයි. මෙය සති විසිහතරක පුහුණු වැඩසටහනක් වන අතර සතියකට එක් දිනක් පවත්වනු ලැබේ. මෙම වර්ෂයේදී 29 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගී විය.

❖ **ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ශිල්ප හැඳුනුම්පත් නිකුත් කිරීම**

2014 අංක 33 දරන සිඩා පනතට අනුව හඳුනාගත් ඉදිකිරීම් ව්‍යාපෘතිවල යෙදී සිටින ඉදිකිරීම් ශිල්පීන් සිඩා හි ලියාපදිංචි විය යුතු අතර ශිල්ප හැඳුනුම්පතක් තිබිය යුතුය. ඔවුන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සහ වැඩි දියුණු කිරීම සහ ඉදිකිරීම් කර්මාන්තය තුළ නිසි පිළිගැනීමක් ලබා දීම සඳහා "පුහුණු පුද්ගලයින්" ලියාපදිංචි කිරීමට අදාළ පනතේ විධිවිධාන ඇත. අයදුම්පත් පහත සඳහන් කාණ්ඩ යටතේ සකස් කරන ලදී.

❖ **ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ශිල්ප හැඳුනුම්පත් නිකුත් කිරීම**

ඔවුන් සතුවේ. ඔවුන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සහ වැඩි දියුණු කිරීම සහ ඉදිකිරීම් කර්මාන්තය තුළ නිසි පිළිගැනීමක් ලබා දීම සඳහා "පුහුණු පුද්ගලයින්" ලියාපදිංචි කිරීමට අදාළ පනතේ විධිවිධාන සලසා ඇත. පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර 2 යටතේ ලියාපදිංචිය සිදු කෙරේ.

1. පුහුණු ඉදිකිරීම් ශිල්පී
2. ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකයින්, මධ්‍ය මට්ටමේ තාක්ෂණ නිලධාරීන් සහ ඉදිකිරීම් කර්මාන්තයේ අනෙකුත් වෘත්තිකයන්

ශිල්ප හැඳුනුම්පත් පහත සඳහන් ශිල්ප කාණ්ඩයන් 11 යටතේ හඳුනාගත් පුහුණු ඉදිකිරීම් ශිල්පීන්ට නිකුත් කෙරේ.එනම් ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු), විදුලි කාර්මික, දැව ශිල්පී (ගොඩනැගිලි), ජලනල ශිල්පී, දැව ශිල්පී

(ලී බඩු), යකඩ නවන්නන්, ටයිල් අතුරන්නන්, වෙල්ඩින්, පින්තාරුකරුවන් (ගොඩනැගිලි), ඇලුමිනියම් ෆැබරිකේටර් සහ වෙනත් මතුවන ශිල්පියන් ශිල්පි හා ප්‍රධාන ශිල්පි ලෙස ප්‍රධාන ශ්‍රේණි දෙකකට කාඩ්පත් නිකුත් කෙරේ.

නිවාස සැලසුම් කිරීම සහ ගොඩනැගිලි පිළිබඳ මධ්‍යස්ථානය

නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) යනු ISO 9001: 2015 සහතිකලත් ආයතනය, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අංක POI / 054 දරන සීඩා කළමනාකරණ සීමාව යටතට එන බහු ශික්ෂණ ආයතනයකි. මෙම ආයතනය බත්තරමුල්ල, පැලවත්ත, පාර්ලිමේන්තු පාර, අංක 33 හි ස්ථානයේ පිහිටා ඇත. තාක්ෂණවේදීන්ගේ සහ වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධනය අරමුණු කරගත් පාඨමාලා පැවැත්වීම නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) විසින් අවධාරණය කෙරේ. මෙම තාක්ෂණික සැසි සඳහා ලැබෙන අතිමහත් ප්‍රතිචාරය, වඩා වටිනා පාඨමාලා පැවැත්වීමේ දී නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයෙහි (CHPB) වෘත්තීයභාවය පිළිබඳ ලැබෙන සාක්ෂියකි.





❖ **නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ (CHPB) පුහුණු පාඨමාලා**

ඉදිකිරීම් හා ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයන් සඳහා හිඳැස් පිරවීමේ පුහුණු වැඩසටහන් CHPB විසින් සපයයි. අපගේ ප්‍රධාන ඉලක්ක කණ්ඩායමට, ඉදිකිරීම් කර්මාන්තය ගැන කැමැත්තක් දක්වන විධායක නිළධාරීන්, ඉංජිනේරුවන්, උනන්දුවන්නන්, ඉදිකිරීම් කළමනාකරුවන් සහ පාසල් හැරයන්නන් ඇතුළත් වේ.

අධීක්ෂකයින් ලෙස හූ දර්ශන ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට කැමත්තක් දක්වන පාසල් හැරගිය අය සහ තරුණ උද්‍යෝගීන් සඳහා හූ දර්ශන සංවර්ධන සහකාර (NVQ 4) පාඨමාලාව නිර්මාණය කර ඇත.

අභ්‍යන්තර නිර්මාණ වැඩසටහන් කාණ්ඩ දෙකක් යටතේ එනම්, පාසල් හැර ගිය අය සඳහා අභ්‍යන්තර අලංකරණ ශිල්පි (NVQ 4) සහ ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර නිර්මාණ ක්ෂේත්‍රයේ සේවකයන් ඉලක්ක කරමින් අභ්‍යන්තර සැලසුම් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලැබේ.

ප්‍රමාණ සමීක්ෂණ වැඩසටහන් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා යන කාණ්ඩ දෙක යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලා ඉදිකිරීම් වැඩ අධීක්ෂකයින්, තාක්ෂණ නිලධාරීන්, සහකාර ප්‍රමාණ පරීක්ෂකයන් සහ සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන්නන් සඳහා ඉලක්ක කෙරේ. ප්‍රමාණ සමීක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NVQ 4) හා ප්‍රමාණ සමීක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) විෂය මාලාව මත පදනම්ව ව්‍යුහගත කර ඇත.

❖ **ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රය සඳහා අර්ධකාලීන පාඨමාලා**

- 21 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ප්‍රමාණ සමීක්ෂණ සහකාර සහතිකය - එක් වැඩසටහනක්

ඉහත වැඩසටහන් 2020 වර්ෂය තුළ පවත්වන ලදී. ප්‍රායෝගිකව ප්‍රමාණ සමීක්ෂණයේ යෙදෙන අයගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා මෙම පාඨමාලා සැලසුම් කරන ලදී.

❖ **ඉදිකිරීම් කර්මාන්තයට අදාළ පරිගණක පාඨමාලා**

ඉදිකිරීම් කර්මාන්තයට අදාළ පරිගණක පාඨමාලා වර්ග 03ක් 2020 වර්ෂයේදී පවත්වන ලදී.

- 42 දෙනෙකුගේ සහභාගිත්වයෙන් MS ව්‍යාපෘති පාඨමාලාව පිළිබඳ වැඩසටහන් 02 ක්,
- 17 දෙනෙකුගේ සහභාගිත්වයෙන් Auto Cad පාඨමාලා පිළිබඳ වැඩසටහන් 02ක්.

2020 වර්ෂය සඳහා CHPB විසින් කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වන ලදී. එනම්,

- ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රය සඳහා MEP ප්‍රමාණ සමීක්ෂණ 31 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 01 වැඩසටහනක්.
- ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රය සඳහා ප්‍රමාණ බිල්පත් මිල කිරීම් සහ රේට් විශ්ලේෂණය - 13 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 01 වැඩසටහනක්.
- සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සේවකයන් සඳහා ස්ථාන පාඨමාලාව - 13 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 01 වැඩසටහනක්.

දේශීය හා විදේශීය ව්‍යාපෘතිවල වැඩ කරන ඉදිකිරීම් කර්මාන්තයේ යෙදී සිටින ඉංජිනේරුවන්ට, ව්‍යාපෘති කළමනාකරුවන් සහ සැලසුම්කරුවන් සඳහා එය සහයක් වනු ඇත.

සේවකයින්ගේ නිපුණතා උසස් කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා

ඉදිකිරීම් කම්කරුවන්, අධීක්ෂකයින්, තාක්ෂණ නිලධාරීන්, ඉංජිනේරුවන්, විධායක නිලධාරීන් හා ව්‍යවසායකයින්ගේ නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා නිර්මාණය කරන ලදී. මෙම පාඨමාලා හැදෑරීම සඳහා කර්මාන්තයේ පළපුරුද්ද සහ අදාළ සුදුසුකම් අත්‍යවශ්‍ය වේ.

- අභිමත සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් / කෙටි කාලීන පුහුණු පාඨමාලා

ඉදිකිරීම් කටයුතුවල නියැලී සිටින රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලැබෙන විශේෂිත පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය පරිදි සකස් කළ පුහුණු වැඩසටහන් සාර්ථකව සැලසුම් කිරීමට හා ලබා දීමට නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයට (CHPB) හැකි වී තිබේ.

- ජලනල වැඩසටහන - NAITA (25 දෙනෙකුගේ සහභාගිත්වයෙන්)

- වායු සමීකරණ වැඩසටහන - NAITA (24 දෙනෙකුගේ සහභාගීත්වයෙන්)
- කර්මාන්ත ජලනල වැඩසටහන - ඇසට් ඉන්ජිනියරින් (5 දෙනෙකුගේ සහභාගීත්වයෙන්)

සම්මන්ත්‍රණ හා වැඩමුළු

ඉදිකිරීම් කර්මාන්තය පුරා පැතිරී ඇති විවිධ රැකියා කාණ්ඩවල යෙදී සිටින සේවකයන් සඳහා විවිධ මාතෘකා පිළිබඳ දැනුම හා ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානය කර ඇත. දැනුම හුවමාරු කිරීමේ ක්‍රමවේදය දේශන, නිරූපණ, ප්‍රායෝගික, සාකච්ඡා සහ ප්‍රශ්න හා පිළිතුරු සැසි පැවැත්වීමෙන් සිදු කෙරේ.

2020 වර්ෂය සඳහා 512 දෙනෙකුගේ සහභාගීත්වයෙන් CHPB විසින් පවත්වන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු 13 ක් පවත්වන ලදී. CHPB හි අපගේ ආදායම පිළිබඳව කොවිඩ්-19 තත්ත්වයේ බලපෑම අවම කිරීම සඳහා නව ක්‍රමවේදයක් ලෙස අප විසින් මාර්ගගත සම්මන්ත්‍රණ පවත්වන ලදී. එම සම්මන්ත්‍රණ පහත දැක්වේ.

- 23 දෙනෙකුගේ සහභාගීත්වයෙන් විදුලි තාක්ෂණය පිළිබඳ (නේවාසික) සම්මන්ත්‍රණය. (මාර්ග ගත ක්‍රමයට)
- 23 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ඉදිකිරීම් වැඩබිම් වල ආරක්ෂාව පිළිබඳ (මාර්ග ගත ක්‍රමයට)සම්මන්ත්‍රණය.
- 34 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ (මාර්ග ගත) සම්මන්ත්‍රණය.
22	පුහුණු වැඩසටහන් සඳහා ආහාර පාන	153,360.00	43,625.00
23	ආහාර පාන	-	7,235.00
24	කුලී හා කුලී ගාස්තු	1,620.00	
25	වැටුප් හා වේතන	5,216,848.88	5,947,711.05
26	ලිපිද්‍රව්‍ය	-	6,581.93
27	ගමන් වියදම් (දේශීය)	-	1,150.00
28	ජලය	204,590.65	74,983.35
29	සාමාජික හා උප ඍත්තීය කණ්ඩායම්	1,500.00	
	මුළු වියදම	**10,571,429.62**	**13,600,000.00**

අයවැයගත වෙන්කිරීම් වලට අනුව 2020 වර්ෂයේදී, මුදල් අමාත්‍යාංශය විසින් සීඩා ඉදිකිරීම් උපකරණ කාර්මිකයන් සඳහා රු. 10,571,429.62 ක ප්‍රාග්ධන ප්‍රදානයන් මූල්‍යයනය කරන ලදී. සීඩා යටතේ ස්ථාපිත ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය - පැලවත්ත හි ඉදිකිරීම් උපකරණ කාර්මිකයන් සඳහා මෙම ප්‍රාග්ධන ප්‍රදානය උපයෝජනය කරන ලදී.

සටහන 23 – භාණ්ඩාගාර අග්‍රිමය - ප්‍රාග්ධන - රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව ආදර්ශය සහිතව ඉදිකිරීම් කර්මාන්තය සඳහා කුසලතා පුහුණුව

අංකය	විස්තරය	2020					2019			
		මිලියන 154 වැඩසටහන	මිලියන 300 වැඩසටහන	මිලියන 250 වැඩසටහන	මිලියන 93 වැඩසටහන	මිලියන 500 වැඩසටහන	මිලියන 300 වැඩසටහන	මිලියන 250 වැඩසටහන	මිලියන 93 වැඩසටහන	මිලියන 500 වැඩසටහන
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
1.	ප්‍රචාරණය හා ප්‍රදාරන ද්‍රව්‍ය	160.00	4,400.00	-	-	-	265,848.62	40,269.16	-	-
2.	ආධුනිකයන්ගේ දෛනික පොත් වියදම	-	-	-	-	-	-	5,000.00	-	-
3.	බැංකු ගාස්තු	-	-	-	-	-	-	-	-	-
4.	ප්‍රසාද දීමනා ගෙවීම්	-	-	-	-	-	-	-	-	-
5.	පොත් හා සහරා	2,310.00	-	-	-	-	937,432.22	-	-	-
6.	පුහුණුවන්නන් සඳහා මුදල් දීමනා	8,310,825.00	48,869,825.00	-	-	-	94,084,500.00	64,688,750.00	-	-
7.	ජීවනාධාර දීමනා	780,780.00	72,800.00	-	-	-	1,083,423.36	-	-	-
8.	දෛනික වියදම් හා නවාතැන්	-	1,125.00	-	-	-	-	-	-	-
9.	සංවර්ධන පිරිවැය	4,000.00	-	-	-	-	-	-	-	-
10.	සේවක අර්ථසාධක අරමුදල	741,941.56	73,651.98	-	-	-	956,574.92	-	-	-
11.	සේවක භාරකාර අරමුදල	148,388.30	14,730.40	-	-	-	191,314.98	-	-	-
12.	ප්‍රදර්ශන	-	-	-	-	-	-	-	-	-
13.	සහාය කාර්ය මණ්ඩලය සඳහා ගාස්තු හා දීමනා	2,502,160.00	3,195,060.00	879,360.00	1,059,260.00	1,189,100.00	8,580,798.50	12,000.00	-	-
14.	ඉගැන්වීම් කාර්ය මණ්ඩලය සඳහා ගාස්තු හා දීමනා	724,400.00	3,926,782.00	-	-	-	1,724,300.00	3,216,501.00	-	-
15.	උපදේහකයින් සඳහා ගාස්තු හා දීමනා		64,950.00							
16.	මගී වාහන සඳහා ඉන්ධන තෙල් ධාවන වියදම්	65,820.00	394,274.00	-	-	-	1,752,759.00	382,252.00	-	-
17.	වෙනත් වාහන සඳහා ඉන්ධන තෙල් ධාවන වියදම්	-	-	-	-	-	4,800.00	-	-	-
18.	ශාලා ගාස්තු	-	-	-	-	-	10,000.00	13,000.00	-	-
19.	උපකරණ කුලියට දීම	-	-	-	-	-	5,000.00	27,250.00	-	-
20.	සෞඛ්‍ය හා ඝනීපාරක්ෂණ	17,816.00								
21.	නවාතැන්	43,000.00	688,540.00	-	-	-	1,399,322.50	453,470.00	-	-

22.	විවිධ	1,000.00	3,650.00	-	-	-	6,790.00	5,877.00	-	-
23.	කාර්යාල අවශ්‍යතා	-	-	-	-	-	27.68	-	-	-
24.	වෙනත් දීමනා	300,000.00	24,000.00	-	-	-	416,650.00	-	-	-
25.	වෙනත් - පුහුණු	-	-	-	-	-	-	-	-	-
26.	අතිකාල හා නිවාඩු දින ගෙවීම් 1	-	-	-	-	-	410,200.51	-	-	-
27	අතිකාල හා නිවාඩු දින ගෙවීම්	122.171.02	618,589.92	-	-	-	1,936,326.75	1,395,019.93	-	-
28	ඡායා පිටපත් වියදම්	37,581.69	5,757.00	-	-	-	229,254.39	139,647.21	-	-
29	තැපැල් ගාස්තු	164,250.00	40,828.00	-	-	-	70,180.00	9,340.00	-	47,770.00
30	මුද්‍රණ, යතුරු ලියන හා පරිවර්තන	-	-	-	-	-	130.00	-	-	-
31	පුහුණු වැඩසටහන් සඳහා ආහාරපාන	438,600.00	578,875.00	-	-	-	1,220,533.00	539,960.00	-	-
32	ආහාරපාන	129,941.00	619,985.50	-	-	-	1,310,215.00	567,671.50	-	-
33	කුලී හා කුලී ගාස්තු	-	140,286.00	-	-	-	2,629,569.50	864,895.00	-	-
34	ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු	-	-	-	-	-	1,148,511.19	132,099.71	-	-
35	මගී වාහන අලුත්වැඩියා හා නඩත්තු	-	3,150.00	-	-	-	9,650.00	2,100.00	-	-
36	වෙනත් වාහන අලුත්වැඩියා හා නඩත්තු	-	-	-	-	-	300.00	-	-	-
37	වැටුප් හා වේතන	4,165,497.02	562,914.25	-	-	-	6,304,000.73	7,000.00	-	-
38	ශිල්ප සවිය මෙවලම් කට්ටල	-	3,920,000.00	-	-	-	18,883,600.91	-	-	-
39	ලිපිද්‍රව්‍ය	4,515.05	275.00	-	-	-	20,724.13	-	-	-
40	දුරකථන	105.258.25	49,527.88	-	-	-	175,483.52	17,039.31	-	-
41	පුහුණු ආධාර	-	-	-	-	-	-	-	-	-
42	පුහුණු ද්‍රව්‍ය	3,537,840.00	322,590.00	-	-	-	-	3,285.00	-	-
43	ගමන වියදම් (දේශීය)	53.250.00	379,004.20	-	-	-	82,251.40	27,007.50	-	-
44	ගමන් වියදම් (ආදායම් උත්පාදනය)	-	900.00	-	-	-	-	-	-	-
45	පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම්	-	-	-	-	-	14,299,999.94	-	-	-
	එකතුව	**22,401,504.89**	**64,576,471.13**	**879,360.00**	**1,059,260.00**	**1,189,100.00**	**160,150,472.74**	**72,549,434.32**	-	**47,770.00**

අයවැයගත වෙන්කිරීම් වලට අනුව **2020** වර්ෂයේදී, මුදල් අමාත්‍යාංශය විසින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා නිපුණතා පුහුණුව සඳහා රු. **94,000,000.00** ක ප්‍රාග්ධන ප්‍රදානයන් මූල්‍යයනය කරන ලදී. මෙම ප්‍රාග්ධනය මගින් රු. 2020 දී ඉහත පුහුණු වැඩසටහන සඳහා 22,401,504.89 භාවිතා කර ඇත. තවද 2020 වර්ෂයේදී 2019,2018,2017 සහ 2016 වැඩසටහන් සඳහා පිළිවෙලින් රු.64,576,471.13 ,879,360.00,1,059,260.00 සහ රු.1,189,100.00 වියදම් කර ඇත.

සටහන 24 - පුද්ගලික පඩිනඩි

අංකය	විස්තරය	2020 රු.	2019 රු.
1.	වැටුප් හා වේතන	120,019,584.36	112,973,579.16
2.	ජීවනාධාර දීමනා	22,899,942.69	23,783,268.09
3.	පැමිණීමේ දිරි දීමනා	9,779,199.41	7,435,172.67
4.	දුවිලි දීමනා	126,100.00	254,500.00
5.	වැඩ බැලීමේ දීමනා	810,619.14	426,151.07
6.	වෙනත් දීමනා	8,324,768.06	5,446,486.29
7.	අතිකාල / නිවාඩු දින වැටුප්	16,250,037.81	20,961,960.63
8.	අතිකාල / නිවාඩු දින වැටුප් (1)	1,495,438.69	3,305,861.50
9.	වෘත්තිය මඩුල්ල සඳහා සාමාජික දායකත්වය	77,411.00	58,830.00
10.	ප්‍රසාද දීමනා ගෙවීම්	3,366,225.00	3,513,032.86
11.	සේවක අර්ථසාධක අරමුදල	21,068,959.80	19,832,319.21
12.	සේවක භාරකාර අරමුදල	4,213,791.90	3,964,288.92
13.	පාරිතෝෂික	17,208,952.50	13,693,972.50
	එකතුව	**225,641,030.36**	**215,649,422.90**

සටහන 25 - ගමන් වියදම්

අංකය	විස්තරය	2020 රු.	2019 රු.
1	ගමන් වියදම් - (දේශීය)	1,186,197.56	1,880,815.25
2	ගමන් වියදම් - (ආදායම් ජනනය වන)	573,310.00	403,952.00
3	ගමන් වියදම් - (විදේශීය)	-	9,500.00
	මුළු ගමන් වියදම්	**1,759,507.56**	**2,294,267.25**

සටහන 26 - සැපයුම් හා අවශ්‍යතා

අංකය	විස්තරය	2020 රු.	2019 රු.
1	ඡායා පිටපත් වියදම්	4,264,209.73	9,421,108.19
2	ලිපිද්‍රව්‍ය	370,590.79	2,352,333.00
3	කාර්යාල අවශ්‍යතා	292,692.06	207,728.30
4	මුද්‍රණ, යතුරු ලියන හා පරිවර්තන	147,662.81	400,190.00
5	පොත් හා වාර සඟරා	375,696.69	687,833.64
6	අපහරණ හා විනාශ කිරීම්	239,514.17	62,296.11
7	ශ්‍රව්‍ය දෘශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	7,014.41	61,940.33
	එකතුව	**5,697,380.66**	**13,193,429.57**

සටහන 27 - නඩත්තු වියදම්

අංකය	විස්තරය	2020 රු.	2019 රු.
1	ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	539,579.51	2,450,963.41
2	ලී බඩු හා කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	2,651,589.30	2,809,087.01
3	මගී වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	4,254,529.72	2,930,430.51
4	වෙනත් වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	343,421.95	514,019.14
5	පිරියත, යන්ත්‍ර හා උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	2,923,501.38	2,549,895.03
6	මෙවලම් හා උපකරණ ද්‍රව්‍ය අලුත්වැඩියාව	111,774.17	-
7	වෙනත් අලුත් වැඩියා හා නඩත්තු / තොරතුරු තාක්ෂණ, යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	747,477.90	971,180.37
8	රක්ෂණ (වාහන)	2,839,477.13	3,017,826.21
	එකතුව	**14,411,351.06**	**15,243,401.67**

සටහන 28 - ඉන්ධන හා උපයෝගීතා ගෙවීම්

අංකය	විස්තරය	2020 රු.	2019 රු.
1	මගී වාහනවල ඉන්ධන හා ධාවන වියදම්	5,734,214.80	6,922,353.88
2	වෙනත් වාහනවල ඉන්ධන හා ධාවන වියදම්	755,379.35	1,659,616.62
3	කුලී හා කුලී ගාස්තු	234,686.49	950,548.12
4	තැපැල්	1,523,314.61	1,367,015.38
5	දුරකථන ගාස්තු	2,815,905.46	2,415,364.80
6	අන්තර්ජාල ගාස්තු	305,412.21	1,148,600.51
7	විදුලි ගාස්තු	7,745,250.95	10,460,452.59
8	ජල ගාස්තු	929,900.70	1,629,307.70
9	සෞඛ්‍ය හා සනීපාරක්ෂණ	5,628,432.14	5,501,297.08
10	ආරක්ෂක සේවා	5,894,822.20	4,737,450.00
	එකතුව	**31,567,318.92**	**36,792,006.68**

සටහන 29 - පර්යේෂණ, සංවර්ධන හා පුහුණු වියදම්

අංකය	විස්තරය	2020 රු.	2019 රු.
1	අලුත් කිරීමේ ගාස්තු - TVEC	80,981.92	4,000.00
2	ශිෂ්‍යත්ව හා පුහුණු - (දේශීය)	61,650.00	279,100.00
3	ශිෂ්‍යත්ව හා පුහුණු - (විදේශීය)	-	293,240.61
4	ස්ථාන පරීක්ෂා දීමනා	-	1,116,806.30
5	උපදේශකවරුන්ට ගාස්තු හා දීමනා	169,050.00	628,765.00
6	ඉගැන්වීමේ කාර්යමණ්ඩලයට ගාස්තු හා දීමනා	7,884,820.00	12,258,844.00
7	සහාය කාර්යමණ්ඩලයට ගාස්තු හා දීමනා	5,000.00	170,635.45
8	සංවර්ධන පිරිවැය	9,000.00	507,912.50
9	පුහුණු ද්‍රව්‍ය	27,235.45	202,667.28
10	පුහුණු සඳහා ඉන්ධන	219,669.35	2,182,144.44
11	පුහුණු ආධාර	-	2,000.00
12	අත් මෙවලම් හා කුඩා උපකරණ	26,389.68	284,540.68
13	පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම්	1,288,764.11	11,203.31
14	පුහුණු වැඩසටහන් සඳහා ආහාර පාන	4,295,125.00	10,363,033.00
15	වෙනත් - පුහුණු	1,500.00	19,435.00
17	පුහුණුවන්නන් සඳහා මුදල් දීමනා	1,830,750.00	2,168,250.00
18	උපකරණ කුලියට දීම	47,000.00	181,550.00
19	සේවක සුභ සාධන	-	172,000.00
20	ශාලා ගාස්තු	618,830.00	294,746.00
21	වෙබ් පදනම ඉදිකිරීම් ලියාපදිංචි කිරීමේ වියදම්	-	896,500.00
	එකතුව	**16,565,765.52**	**32,037,373.57**

සටහන 30 – මූල්‍ය පිරිවැය

අංකය	විස්තරය	2020 රු.	2019 රු.
1	බැංකු ගාස්තු	163,290.00	543,154.00
2	කල් බදු පොලී - මූල්‍ය කල්බදු	3,015,403.83	3,660,635.39
	එකතුව	**3,178,693.83**	**4,203,789.39**

සටහන 31 – ක්ෂය

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ 2020 වර්ෂය සඳහා මුළු ක්ෂය වියදම රු. 93,647,353.69 කි. වාර්තාකරණ දිනයට තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත පරිදි වේ.

	වත්කම් වර්ගය	2020	2019
		(රු.)	(රු.)
*	පුස්තකාල පොත්-CETRAC	786,270.00	-
*	පුස්තකාල පොත් -Head Office	1,216,921.48	-
*	මෙවලම් හා උපකරණ	17,833,504.77	-
*	ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ	55,651,616.23	-
*	ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	4,330,649.58	4,251,259.57
	එකතුව	79,818,962.06	4,251,259.57

සටහන 32 – වෙනත් වියදම්

අංකය	විස්තරය	2020 රු.	2019 රු.
1	ජාතිය ගොඩනැගීමේ බදු (NBT)	-	3,619,872.00
2	සේවකයන් සඳහා නිල ඇඳුම්	605,366.46	1,186,524.76
3	සේවකයන් සඳහා තේ	1,163,382.50	2,030,825.83
4	සෞඛ්‍ය රක්ෂණ	3,167,000.00	2,860,457.37
5	වෙනත්	1,419,179.62	32,866.57
6	සුභසාධන	132,000.00	240.00
7	ප්‍රදර්ශන	-	292,235.60
8	ප්‍රචාරණය හා ප්‍රචාරන ද්‍රව්‍ය	1,890,953.35	5,466,149.48
9	ආහාර පාන	865,813.08	1,427,402.78
10	ආසන දීමනා	1,415,400.00	3,387,400.00
11	විගණන ගාස්තු	935,167.00	908,113.00
12	සේවා කොන්ත්‍රාත්	-	81,632.66
13	නෛතික ගාස්තු	74,425.00	121,000.00
14	බලපත්‍ර ගාස්තු	379,309.29	463,991.67
15	විවිධ වියදම්	53,944.00	270,947.89
16	කුලී හා රේට්	-	85,157.30
17	කල්බදු ක්‍රමක්ෂය	32,613.64	32,613.64
18	තාවකාලික නවාතැන්	3,520.00	156,245.00
19	රදවා ගැනීමේ බදු වියදම්	-	113,000.00
20	නවාතැන් සඳහා දෛනික වියදම්	-	4,000.00
21	අඩමාන ණය ඌන ප්‍රතිපාදනය	712,895.88	643,605.55
22	ඉදිකිරීම් විශිෂ්ටත්වය පිළිබඳ වියදම්	228,115.00	-
23	ISO වාර්ෂික ගාස්තු	97,959.20	-
24	සේ.අ.අ. වන්දි	2,695,954.44	-
25	සේ.හා.අ. වන්දි	21,966,287.50	-
26	මෙහෙයුම් කල්බදු	200,000.00	-
	එකතුව	**38,039,285.96**	**23,184,281.10**

සටහන - 33

භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන (පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රික පාඨමාලාව) සහ ප්‍රාග්ධනය සඳහා අග්‍රිමය - (රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව ආදර්ශය වැඩසටහන් සහිත ඉදිකිරීම් කර්මාන්තය සඳහා ශිල්ප පුහුණු) මුදල් අමාත්‍යාංශය මඟින් ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ මූල්‍යයනය කෙරේ. තවද අදාළ වර්ෂයේ ප්‍රාග්ධන වියදම් හා ආදායම සමාන මුදලකට තාර්කික පදනමක් මත අදාළ වර්ෂයේ හඳුනාගනු ලබන අතර එම ආදායම හා වියදම සීඩා ගිණුම්කරණ ප්‍රතිපත්ති (ප්‍රාග්ධන ප්‍රදාන) වලට අනුකූලව අදාල වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනම දක්වනු ලැබේ.

සටහන - 34 මුදල් හා බැංකු

අධිකාරියේ ක්ෂණික මුදල් අවශ්‍යතාවයන් මත රඳා පවතින කෙටි කාලීන තැන්පතු විවිධ කාල පරිච්ඡේදයන් සඳහා තැන්පත් කර ඇති අතර අදාල කෙටි කාලීන තැන්පතු රේටයට පොලිය උපයා ගනී. අධිකාරියේ රු. මිලියන 436.5 ක්වූ බැංකු ශේෂය තුල සංවර්ධප ව්‍යාපෘති සඳහා යොදාගත යුතු රු. මිලියන 256.13 ක මුදලක් ඇතුලත් වේ.

සටහන - 35 තොග

තොග පිරිවැය පදනම මත දක්වා ඇත. තොග වලට අමතර කොටස්, නඩත්තු විෂයයන්, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය, ලිපි ද්‍රව්‍ය හා වෙනත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ආදිය ඇතුලත් වේ. සාමාන්‍ය තොග පිරිවැය මත නිකුත් කරන ද්‍රව්‍ය පිරිවැය පදනම මත දක්වා ඇත. අවසන් තොගයේ ශුද්ධ උපලබ්ධි අගය වන රු. 239,514.17 ක තොගයක් වර්ෂය තුලදි තොග හානි ලෙස සටහන් කරන ලදී.

සටහන - 36 වාර්තාකරණ දිනයට පසු සිදුවීම්

දිගුකාලීන හිඟ හිටි ණයගැතියන් (වර්ෂ 10 කට වැඩි) සහ දිගු කාලීන ගෙවිය යුතු ණය හිමියන් (වර්ෂ 02 කට වැඩි) විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය යටතේ හා සීඩා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය යටතේ ලියා හැර ඇත. එය රු. 4,559,101.09 ක ණයගැතියන් හා රු. 514,695.15 ක ණයහිමියන් ගෙන් සමන්විත විය. රු. 657,785.00 ක ණයගැති රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ලියා හරිනු ඇත. අදාල ගැලපීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 06 - වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම් - ප්‍රකාරව ගැලපීම් කරනු ලැබේ.

සටහන - 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්

නෛතික නඩු කටයුතු, නඩුවේ ස්වභාවය හා තත්ත්වය සමඟ හෙළිදරව් කර ඇත. 2020 දෙසැම්බර් 31 දිනට සඳහන් කළ යුතු පහත සඳහන් නඩු පවතී.

අංකය	නඩුවේ ඉල්ලුම්කරු	උසාවිය / ආයතනය	පියවර	දායක මුදල රු.	අධිභාරය රු.	එකතුව රු.
1	සිඩා සේවකයන්ගෙන් සමන්විත ජාතික සේවක සංගමය	කම්කරු දෙපාර්තමේන්තුව	01.01.2006 සිට 01.06.2011 දක්වා කාලය තුල ඉක්ටැඩ සේවකයන් සඳහා සේ.අ.අ. නිහ මුදල්	14,977,525	7,488,762.50	22,466,287.50
2	සේවක භාරකාර අරමුදල්	සේවක භාරකාර අරමුදල් මණ්ඩලය	01.01.2006 සිට 01.06.2011 දක්වා කාලය තුල ඉක්ටැඩ සේවකයන් සඳහා සේ.භා.අ. නිහ මුදල්	1,797,303	898,651.44	2,695,954.44
	මුළු මුදල					**25,162,241.94**

අදාල ගැලපීම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රකාරව ගැලපීම් කර ඇත.

සටහන - 38 - කල්බදු

පහත සඳහන් වත්කම් 2019 වර්ෂයේ ජනවාරි මාසයේ මූල්‍ය කල්බදු යටතේ මිලදී ගෙන ඇත.

අංකය	වත්කම් වර්ගය	පිරිවැය රු.	වාර්තාකරණ දිනයට ක්ෂය සඳහා ප්‍රතිපාදන	ශුද්ධ ධාරණ අගය	කල්බදු කාලය	බදුකරු
1.	මිට්සුබිෂි - මෝටර් රථය	11,035,490.00	2,758,872.50	8,276,617.50	වර්ෂ 05	ලංකා බැංකුව
2.	මිට්සුබිෂි - මෝටර් රථය	11,035,490.00	2,758,872.50	8,276,617.50	වර්ෂ 05	ලංකා බැංකුව
3.	මිට්සුබිෂි - මෝටර් රථය	11,035,490.00	2,758,872.50	8,276,617.50	වර්ෂ 05	ලංකා බැංකුව
	එකතුව	**33,106,470.00**	**8,276,617.50**	**24,829,852.50**		

මෙහෙයුම් කල්බදු.

පහත සඳහන් වත්කම් මෙහෙයුම් කල්බදු යටතේ ගෙන ඇත.

අංකය	වත්කම් වර්ගය	කල්බදු වටිනාකම රු.	වාර්තාකරණ දිනයට ක්ෂය සඳහා ප්‍රතිපාදන	ශුද්ධ ධාරණ අගය	කල්බදු කාලය	බදුකරු
1.	වාසභූමි සැලසුම් හා සංවර්ධනය සඳහා මධ්‍යස්ථානය	2,851,477.20	470,681.84	2,380,795.36	වර්ෂ 99	නාගරික සංවර්ධන අධිකාරිය
2.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	-	එක් වසරකට 200,000.00	-	වර්ෂ 30	ටවර් හෝල් රහහල පදනම
	එකතුව	**2,851,477.20**	**470,681.84**	**2,380,795.36**		

සටහන -39 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වාර්තාකරණ දිනයට ගල්කුලම - මෙහෙයුම් පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත වැසිකිළි පද්ධතිය සිදුකරමින් යන ප්‍රාග්ධන වැඩ වල දැක්වේ.

සභාපති

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ ඒකාබද්ධව කියවන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවල **(SLPSAS)7— දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ** හි 65 වැනි ඡේදය අනුව අධිකාරිය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන රු. මිලියන 79.82ක පිරිවැයක සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, **SLPSAS 3— ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂවලට** අනුව ඉහත සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලයෙහි ඇස්තමේන්තු දෝෂය නිවැරදි කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කර නොතිබුණි.

(ආ) පිරිවැය සහ පවතින වටිනාකම පිළිවෙළින් රු. 19,512,500 සහ රු. 7,317,187 වන යන්ත්‍රෝපකරණ සහ උපකරණ දහතුනක් (13) 2020 ජනවාරි 01 දිනට 2019 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණවලදී භාවිතයට නුසුදුසු බවට හඳුනාගෙන ඇත. එයට සමගාමීව 2021 ඔක්තෝබර් 31 දින දක්වා මෙම අයිතම බැහැර කිරීමට පියවර නොගෙන 2020 වර්ෂයේදී රු. 7,317,187 ගිණුම් ඇස්තමේන්තුවල වෙනසක් ලෙස රඳවාගත් ලාභයට ගලපා තිබුණි. තවද, **SLPSAS 3— ගිණුම්කරණය. ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ** හි 44 වගන්තිය ප්‍රකාරව මේ සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක ක්‍රියාත්මක වන අධිකාරියේ ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) සඳහා හිමිකම් ඔප්පුව ලබාදීම සඳහා රු. 54,890,701ක් වන මුළු මුදල පියවීමට 2019 වර්ෂය තුළදී නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් ඉල්ලා ඇත. කෙසේවෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා ද මෙම මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙත පියවීමට අධිකාරිය අපොහොසත් වී ඇති අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් විශිෂ්ටතා සම්මාන උළෙල නොපැවැත්වුවද, 2020 වර්ෂයේදී මෙම උත්සවය පැවැත්වීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබුණු රු. 2,633,914ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම බැරකමක් ලෙස නොසලකමින් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් නොවන ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා වූ අතිරික්තය ජංගම බැරකම සමාන ප්‍රමාණයකින් අඩුවෙන් ප්‍රකාශ කිරීම මගින් අධිතක්සේරු කර ඇත.

(ඊ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වසර 13ක අඛණ්ඩ අධ්‍යාපන (NVQ) පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා 2020 වර්ෂය තුළ අධිකාරියට රු. 45,844,000 ක් වෙන් කර තිබුණි. එයින් රු. 10,000,000 සහ රු.35,844,000 ක් පිළිවෙලින් සමාලෝචිත වර්ෂය තුළ සහ 2021 දී ලැබී ඇත. එසේ වුවද, අධිකාරිය විසින් 2020 වසර සඳහා රු. 45,398,000ක් ආදායම ලෙස හඳුනාගෙන තිබුණද වාර්තා කරන කාල සීමාව තුළ මෙම පුහුණු වැඩසටහන සඳහා රු. 5,906,904ක් පමණක් වැය කර තිබුණි.

තවද, දරන ලද වියදම් සහ එහි කවර හෝ අතිරික්තයන් මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම අනාවරණය කර නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුළු එකතුව රු. 22,609,256 ක් වූ ගිණුම් අයිතම පහක (05) නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා එම අයිතම සම්බන්ධයෙන් සවිස්තරාත්මක උපලේඛන, බදු සහ කුලී ගිවිසුම් සහ ශේෂය තහවුරු කිරීම වැනි විගණන සාක්ෂි කැඳවා තිබුණද විගණනය සඳහා ලබා දී නොතිබුණි.

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිතීන් යටතේ, මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් කොටසෙහි තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

1.3. අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු ඇතුළත් නමුත් මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මාගේ විගණක වාර්තාව ඇතුළත් නොවේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මා ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු කියවා, එසේ කිරීමේදී, අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේ දී මා ලබාගත් දැනුම සමඟ ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න හෝ එසේ නොමැති නම් සාවද්‍ය ලෙස ප්‍රකාශ කර තිබෙද යන්න සලකා බැලීම වේ.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත මා විසින් ඉටු කරන ලද කාර්යය මත පදනම්ව, අනෙක් තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇති බව මා නිගමනය කරන්නේ නම්, එම කරුණ වාර්තා කිරීමට මා බැඳී සිටිමි. මේ සම්බන්ධයෙන් මා හට වාර්තා කිරීමට කිසිවක් නොමැත.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශ්ව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණනකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම් වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවෙන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැක.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු අඩුපාඩුවක් ඇතුළුව, වෙනත් කාරණා අතර, සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන්, පාලනය සම්බන්ධයෙන් වගකීම් පැවරී ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

2. වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි පහත අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

2.1.1. විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර මාගේ විමර්ශනයෙන් පෙනෙන පරිදි, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) හි අවශ්‍යතාවය අනුව අධිකාරිය විසින් නිසි ගිණුම් වාර්තා තබා ඇත.

2.1.2. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව ඉකුත් වසරට අනුකූල වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (l) (ඇ) (iv) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව ඉකුත් වර්ෂයේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වේ.

2.2. අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණු සඳහා පමණක් සීමා වූ අතර පහත සඳහන් කරුණු සඳහා ප්‍රකාශ කිරීමට කිසිවක් මාගේ අවධානයට ලක්ව නැත;

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව සාමාන්‍ය කටයුතුවලින් බැහැරව අධිකාරිය විසින් ඇති කර ගත් කවර හෝ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් අධිකාරියේ පාලක මණ්ඩලයේ කවර හෝ සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර සම්බන්ධයක් ඇති බව ප්‍රකාශ කිරීමට;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව පහත සඳහන් අවස්ථාවල හැර අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ නීතිය, පොදු සහ විශේෂ විධාන කිසිවක් හැර අධිකාරිය අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීමට;

නීති/නියාමන සඳහා යොමුව	විස්තරය
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ II වගන්තිය සහ 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය	රු. 153,231,432 මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහ මුදල් අමාත්‍යවරයාගේ අනුදැනුම නොමැතිව කෙටිකාලීන ආයෝජන මූලාශ්‍ර වන ඇමතුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු ආදියෙහි ආයෝජනය කර ඇත. ඉහත ආයෝජනවලින්, රු. 140,707,803ක මුදලක් වසර 04කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුනි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මූල්‍ය රෙගුලාසි

(i) මූල්‍ය රෙගුලාසි 571 (2)

වසර 2ක කාලයකට වඩා වැඩි සියලුම තැන්පතු අධිකාරියේ ආදායමට බැර කළ යුතු වුවද, එසේ නොකර, 2020 දෙසැම්බර් 31 දිනට රු. 1,787,782ක සහ රු. 159,500ක පිළිවෙළින් ගෙවිය යුතු රඳවාගැනීම් සහ ටෙන්ඩර් තැන්පතු වැනි හඳුනානොගත් සහ කල් ඉකුත් වූ තැන්පතු අධිකාරිය විසින් තැන්පතුවල රඳවාගෙන තිබුණි.

(ii) 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 3/2015 මඟින් සංශෝධිත මූල්‍ය රෙගුලාසි 371සහ අධිකාරිය විසින් නිකුත් කරන ලද 2020 අගෝස්තු 19 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2/2020

-අත්තිකාරම් ලබා දෙන කාර්යය අවසන් වූ වහාම හෝ මුදල් වර්ෂය අවසන් වූ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 13 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ එකතුව රු. 683,700 ක් වූ අත්තිකාරම් දින 30 සිට 170 දක්වා කාලසීමාවක් ප්‍රමාද කිරීමෙන් පසු පියවා තිබුණි.

- එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසන් වීමට පෙර අක් මුදල් අග්‍රිමයේ කවර හෝ ශේෂයක් භාර දිය යුතු වුවද, පාර්ශව හතරකට අවස්ථා 5කදී ලබා දුන් රු. 4,092,735ක එවැනි අග්‍රිම 2020 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණි.

(iii) මූල්‍ය රෙගුලාසි 756, 757, 758 සහ 759

එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජංගම නොවන වත්කම්වල භෞතික පැවතීම සහතික කිරීම සඳහා එක් එක් වාර්තාකරණ කාලසීමාවට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කළ යුතු වුවද, 2021 නොවැම්බර් 30 වනවිටත් අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට අයත් වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ඇ) 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 02/2015 සහ 2018 ජූලි 16 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2018 හි 06 වැනි ඡේදය

අධිකාරිය විසින් 2019 වර්ෂයේදී මූල්‍ය කල්බදු පදනම යටතේ මෝටර් රථ 3ක් මිලදී ගෙන ඇති අතර චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව අධිකාරියට අයත් වාහන තුනක් මේ සඳහා බැහැර කිරීමට නියමිත අතර ඒවා බැහැර කිරීමෙන් ලැබෙන මුදල් මහා භාණ්ඩාගාරයට ගෙවීමට නියමිත විය. කෙසේ වෙතත්, බැහැර කිරීමට යෝජිත එක් වාහනයක් එලෙස බැහැර නොකොට 2021 ඔක්තෝබර් මස දක්වා අධිකාරි පරිශ්‍රයේ තබා තිබුණි. ඊට අමතරව රු. ඉතිරි වාහන දෙක බැහැර කිරීමෙන් ලැබුණු රු. 5,773,000 ක මුදලක්

	වසර දෙකකට වැඩි කාලයක් ගෙවී ගියද භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර අධිකාරිය විසින් රඳවා තබා ගෙන තිබුණි.
(ඇ) 2020 ජනවාරි 27 දිනැති අංක PED/01/2020 දරන මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 06 ඡේදය	එක් එක් සේවාව සඳහා ගාස්තු, ඇස්තමේන්තුගත කාල සීමාවන් ඇතුළු පුරවැසි ප්‍රඥප්ති, යනාදිය කාර්යාල පරිශ්‍රවල සහ වෙබ් අඩවිවල මහජනතාවට / පාරිභෝගිකයන්ට ප්‍රදර්ශනය කළ යුතු බවට සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වග බලා ගත යුතුය. කෙසේවෙතත්, අධිකාරිය මෙම උපදෙස්වලට අවනත වී නොමැත.
(ඉ) යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/12	ඔවුන්ගේ සමාලෝචනය සහ සාකච්ඡා සඳහා ඉන්වෙන්ටරි කාල විශ්ලේෂණය මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීම අවශ්‍ය වුවද, ඔවුන්ගේ ගිණුම්කරණ පද්ධතියෙන් ඉන්වෙන්ටරි කාල වාර්තාවක් උත්පාදනය කිරීමට අධිකාරියට හැකියාවක් නොමැත. එබැවින්, ඉන්වෙන්ටරි කාල විශ්ලේෂණය මත පදනම්ව සෙමින් චලනය වන, චලනය නොවන සහ යල් පැන ගිය අයිතම හඳුනාගැනීමේ දුෂ්කරතාවයන්ට අධිකාරිය මුහුණ දී සිටී. 2019 වර්ෂය සඳහා වූ අධිකාරියේ වාර්ෂික වාර්තාව මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා ද පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් නීති රීති අන්තර්ගත ක්‍රියා පටිපාටි අත්පොතක් තිබිය යුතු වුවද, අධිකාරියේ මානව සම්පත් සුමට හා ඵලදායී පරිපාලනය සඳහා එවැනි අනුමත අත්පොතක් අධිකාරිය සතුව නොතිබුණි.
(ඊ) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 03 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂණයකින්ම මාස 12ක කාලයකට පසුව හෝ කිලෝමීටර් 25,000ක දුරක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමේ ප්‍රධාන අලුත්වැඩියාවක් සිදු කිරීමෙන් පසුව යන කවර හෝ අවස්ථාවකින් ප්‍රථමයෙන් එළඹෙන අවස්ථාවේදී ඉන්ධන පරිභෝජනය නැවත පරීක්ෂා කළ යුතුය. කෙසේවෙතත්, එවැනි ඉන්ධන පරීක්ෂණ වාර්තාවක් අධිකාරියට අයත් වාහන 50ක් සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/01/2015	නිලධාරීන් 05 දෙනෙකු විසින් අනුමත මාසික ඉන්ධන සීමාවන් ඉක්මවා රු. 621,076 ක වටිනාකමකින් යුත් ඉන්ධන ලීටර් 4,436 ක් ලබා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) රු. 2016 සිට 2020 දක්වා කාලය තුළ මහා භාණ්ඩාගාරය විසින් PPP ආකෘතිය යොදා ගනිමින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා නිපුණතා පුහුණුව ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය හරහා අධිකාරියට රු. මිලියන 1,077ක් නිදහස් කර ඇත. එයින් රු. මිලියන 114.2 ක් අපේක්ෂිත කාර්යය සඳහා යොදවා නොතිබූ අතර 2020 ඔක්තෝබර් 31 දින දක්වා ද ජංගම බැංකු ගිණුමක රඳවා තිබුණි.

(ආ) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින පුහුණු ශිල්පීන් සඳහා ශිල්පී හැඳුනුම්පත ලබාදීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 35.7ක් ලැබී ඇත. එයින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වසරේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට (ICTA) අත්තිකාරම් වශයෙන් රු. මිලියන 11.3ක් ලබා දී තිබුණි. මෙම කාර්යය 2020 වර්ෂයේදී අවසන් කළ යුතු වුවද 2021 නොවැම්බර් මාසය අවසානය දක්වා ද එය අවසන් කර නොතිබුණි.

තවද, . මිලියන 11.3 ක අත්තිකාරම් ගෙවීම් වසර දෙකකට වැඩි කාලයක් ICTA ආයතනයෙන් රඳවාගෙන තිබූ අතර සිදුවූ මූල්‍ය අලාභය ගණනය කර වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඇ) ගල්කුලම ප්‍රදේශයේ පවත්වාගෙන යන පුහුණු පාසලේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2018 සිට 2020 දක්වා කාලය තුළ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 135ක් ලබාගෙන ඇත. එයින් සියයට 26 ට සමාන රු. මිලියන 34.6 ක් අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන අධිකාරියේ ජංගම බැංකු ගිණුමේ නිෂ්ක්‍රීයව තබා තිබුණි.

(ඈ) විගණනය සඳහා ලබා දී ඇති තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ වාහන 08ක් අවස්ථා 10කදී අනතුරුවලට ලක්ව ඇති අතර වාහන අනතුරු 06කට අදාළ රක්ෂණ හිමිකම් පමණක් අදාළ රක්ෂණ සමාගමෙන් ඉල්ලා ඇත. කෙසේවෙතත්, ඉතිරි වාහන අනතුරු 04 සඳහා සිදු වූ අලාභය සහ වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික වාර්තා සහ අවසන් වාර්තා විගණනය සඳහා ලබා දී නොතිබුණි.

(ඉ) රු. 6,981,250ක පිරිවැයකින් යුත් අධිකාරියේ වාහන හයක් ප්‍රයෝජනයට ගැනීමක්, අලුත්වැඩියා කිරීමක් හෝ බැහැර කිරීමක් සිදු නොකර (එක් වාහනයක් හැර) CETRAC පරිශ්‍රයේ වසර 2 සිට 5 දක්වා කාලයක් දිරාපත් වන තත්ත්වයට පත් වීමට ඉඩ දී තිබුණි.

(ඊ) 2006 ජනවාරි 01 සිට 2011 මැයි 31 දක්වා කාලයට අදාළව රු. 14,977,525 හි හිඟ සේවක අර්ථසාධක අරමුදල නොගෙවීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල (EPF) විසින් රු. 5,691,460 ක අධිභාරයක් පනවා තිබුණි. කෙසේවෙතත්, මෙම ගෙවිය යුතු මුදල 2021 නොවැම්බර් 30 දින වනවිටත් ප්‍රේෂණය කර නොතිබුණි.

(උ) 2018, 2019 සහ 2020 යන වර්ෂවලදී අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මඟින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක රු. මිලියන 202 ක, රු.මිලියන 260 ක සහ රු. මිලියන 357 ක පමණ සාමාන්‍ය ශේෂයක් කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගෙන රඳවාගෙන තිබූ අතර මෙම ශේෂය 2021 ඔක්තෝබර් 31 දිනට රු. මිලියන 426 දක්වා අඛණ්ඩව ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2018 ජනවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා කාලය තුළ ඉහත මුදල් ජංගම බැංකු ගිණුමක නිෂ්ක්‍රීයව තැබීමෙන් අධිකාරියට දළ වශයෙන් රු. මිලියන 98ක මූල්‍ය අලාභයක් සිදුවී ඇත.

(ඌ) අධිකාරිය විසින් ගල්කුලම ප්‍රදේශයේ සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා 2018 නොවැම්බර් 07 වැනි දින රු.මිලියන 17,296,564 ක කොන්ත්‍රාත් මුදලකට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹ තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ ඇති පොදු කොන්දේසි අනුව, මෙම බංගලාව කොන්ත්‍රාත් ගිවිසුමේ දින සිට දින 210ක් ඇතුළත නිම කළ යුතුය. කෙසේවෙතත්, සංචාරක බංගලාව සම්පූර්ණ කර අධිකාරියට භාර දී ඇත්තේ 2020 ජුනි 18 වන දින වේ. නමුත් ඇවර කළ අලාභ අයකර ගැනීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන ඇතුළත් කර නොතිබූ බැවින් ප්‍රමාද වූ කාලසීමාවේදී කිසිදු ඇවර කළ අලාභ ඉල්ලා සිටීමට අධිකාරියට නොහැකි වී ඇත.

(එ) රු. 14,173,303 ක් වූ මුළු ණයගැති ශේෂවලින් රු. 1,794,089 ක් සඳහා ණය ගැතියන් 06 දෙනෙකුගෙන් පමණක් තහවුරු කිරීම් ලැබී ඇති අතර අනෙකුත් ණය ගැතියන් 2021 ඔක්තෝම්බර් 31 දින දක්වා ද තම හිඟ ශේෂයන් තහවුරු කර නොතිබුණි.

තවද, විගණනයට සපයා ඇති කාල විශ්ලේෂණයට අනුව, රු. 5,115,648ක ණයගැති ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට වසර තුනකට වැඩි කාලයක් අයකර නොගෙන හිඟව තිබූ අතර මෙම මුදල 2021 ඔක්තෝබර් 31 දින දක්වා ද අයකර ගෙන නොතිබුණි.

(ඒ) එකතුව රු. 4,135,111ක් වූ වෙළඳ ණය හිමියන් සහ විවිධ ණය හිමියන්ගේ ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට වසර 05කට වැඩි කාලයක් හිඟව තිබූ අතර මෙම ශේෂය 2021 ඔක්තෝබර් 31 වනවිටත් පියවීමකින් තොරව නොවෙනස්ව පැවතිණි.

(ඓ) 2003 ජූනි 02 දිනැති යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/12 හි 9.4 ඡේදයේ විධිවිධානවලට පටහැනිව අධිකාරියේ සේවකයකු 2015 පෙබරවාරි 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිදහස් කර එවකට රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි. 2015 පෙබරවාරි 09 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා මෙම නිලධාරියාට ආසන්න වශයෙන් රු. 4,687,732 ක වැටුප් සහ අනෙකුත් දීමනා ගෙවා තිබුණද 2021 ඔක්තෝබර් 31 දින දක්වා ද රේඛීය අමාත්‍යාංශයෙන් කිසිදු මුදලක් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

අත්සන් කලේ: ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

4.0 කාර්ය සාධන දර්ශක

අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තථ්‍ය නිමැවුම		
		100%- 90%	75%-89%	50%74%
සංවර්ධන අංශය				
1	CIDA ලියාපදිංචිය පිළිබඳ ක්‍රියාකාරකම් හා පාර්ශවකරුවන් ශ්‍රේණිගත කිරීම	>100		
2	ජාතික ඉදිකිරීම් විශිෂ්ටතාවය හා කාර්ය සාධන සම්මාන වැඩි දියුණු කිරීම සහිතව පැවැත් වීම		83	
3	සුදුසු පුද්ගලයන් ලැයිස්තු ගත කිරීම (සාමාජික නොවන සුදුසු පුද්ගලයින් සංඛ්‍යාව)			<50
4	4.1 සම්මන්ත්‍රණ පැවැත්වීම / පාර්ශවකරුවන් සඳහා වැඩමුළු			<50
5	4.2 - ලියාපදිංචිය සඳහා CCD ලකුණු සලකා බැලීම			<50
6	CIDA ජර්නලය	>100		
උපදේශක සේවා ආයතනය				
1	තාක්ෂණ විගණනය			<50
2	විනිශ්චය කිරීම		78	
3	දැනුවත් කිරීමේ වැඩසටහන			<50
4	කර්මාන්ත සේවා අංශයේ උපදේශන සේවා සැපයීම	>100		
5	ව්‍යාපෘති කළමනාකරණ සේවා /උපදේශන සේවා			<50
6	ප්‍රකාශන		78	
7	ඉදිකිරීම් ආර්ථිකය	>100		
8	ශ්‍රී ලංකාව සඳහා ජාතික ගොඩනැගිලි සංකේත සකස් කිරීම			<50
9	පිරිවැය දත්ත පදනම			<50
කර්මාන්ත පුහුණු අංශය				
1	ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම			<50
2	අධීක්ෂක හා කළමනාකරණ කාර්ය මණ්ඩල ලියාපදිංචි කිරීම			<50
	කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත් කරුවන්ගේ			

3	ධාරිතාව ගොඩනැඟීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම			<50
4	ප්‍රකාශන විකිණීම (විකුණූ ප්‍රකාශන සංඛ්‍යාව ලෙස ඉලක්ක නියම කර ඇත)			<50
5	*රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව (ppp) මොඩියුල සහිත ඉදිකිරීම් අංශයේ කුසලතා වර්ධනය			<50
6	*ලියාපදිංචි වූ පුහුණු ඉදිකිරීම් ශිල්පීන් සඳහා ශිල්ප හැඳුනුපත් නිකුත් කිරීම			<50
නිවාස සැලසුම් හා ගොඩනැගිලි සඳහා මධ්‍යස්ථානය				
1	පුහුණු වැඩසටහන්		79	
2	සම්මන්ත්‍රණ /වැඩමුළු			<50
3	අභිමත සැලසුම් පුහුණු ක්‍රියාකාරකම් එකතුව	>100		
4	NVQ පුහුණු			<50
5	වෙනත් ආදායම් (පහසුකම් කුලියට දීම, ශ්‍රවනාගාර,සම්මන්ත්‍රණ ශාලා, කාමර, පරිගණක රසායනාගාරය ආදිය) පහසුකම් කුලියට දීම. (විභාග ශාස්තූ, පරිශ්‍ර කුලී, ප්‍රකාශන විකිණීම, විවිධ)		73	
6	* E-ඉගෙනුම් හා Live Streaming unit.			<50
ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය				
1	පුහුණු වැඩසටහන්		79	
2	කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත් කරුවන් සංවර්ධන වැඩසටහන			59
3	වැඩපොල අලුත්වැඩියා / වෙළඳ පරීක්ෂණ පැවැත්වීම හා උපදේශක සේවා/ වෙනත් විවිධ වැඩපොල කාර්යයන් හා උපකරණ කුලියට දීම	>100		
4	ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රික පාඨමාලාව			<50
5	වාහන අලුත්වැඩියා			<50
6	වර්ෂ 13 ක සහනික වූ අධ්‍යාපන වැඩසටහන	>100		
ඉදිකිරීම් උපකරණ මෙහෙයුම් පුහුණු මධ්‍යස්ථානය				
1	පුහුණු වැඩසටහන්			65

2	යන්ත්‍ර කුලියට දීම			<50
3	වර්ෂ 13 ක සහතික වූ අධ්‍යාපන වැඩසටහන - ඉදිකිරීම් උපකරණ මෙහෙයුම් පුහුණු මධ්‍යස්ථානය			<50
4	යටිතල පහසුකම් සංවර්ධනය හා මෙහෙයුම් පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම			<50
මානව සම්පත් හා පරිපාලනය				
1	කුලියට දීම (ශ්‍රවනාගාර, සම්මන්ත්‍රණ කාමර හා සමුළු කාමර, සංචාරක බංගලාව		89	
2	දේශීය පුහුණු			<50
3	විදේශීය පුහුණු			<50
4	වෛද්‍ය රක්ෂණය			<50
5	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා පුහුණු මධ්‍යස්ථාන නඩත්තුව හා ප්‍රතිසංස්කරණය කිරීම			<50

5.0 මානව සම්පත් පැතිකඩ

5.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවත්නා සේවක සංඛ්‍යාව	පුරප්පාඩු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	36	30	6
තෘතියික	71	48	23
ද්විතියික	123	92	31
සුළු	160	112	48
එකතුව	**390**	**282**	**108**

5.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන්නේ කෙසේද යන්න කෙටියෙන් දැක්වීම.

ආයතනයේ සියලු මට්ටම්වල අනුමත සේවක සංඛ්‍යාව සම්පූර්ණයෙන් බඳවාගෙන නොමැත. සීඩා පනතේ වගන්ති ප්‍රකාරව කාර්යයන් සම්පූර්ණ කිරීම සහ ව්‍යාපෘති ඉටු කිරීම සඳහා අතිරේක කාලයක්, කාර්ය මණ්ඩල හිඟකම හේතුවෙන් ගැනීමට සිදු වී ඇත. කොවිඩ් 19 වසංගතය හා මැතිවරණ කාල පරිච්ඡේදය හේතුවෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වුවත් 13.08.2020 පුවත්පත් දැන්වීම් මඟින් වඩාත් අවශය තනතුරු පිරවීම සඳහා කටයුතු කර ඇත. ඒ අනුව ඔවුන් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

5.3 සේවකයන්ගේ ධාරිතා වර්ධනය

අංකය	වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාලය	මූළු ආයෝජනය රු.		වැඩසටහනේ ස්වාභාවය දේශීය / විදේශීය	ප්‍රතිඵලය/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	පොදු දේපල පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	68	දින 1	නොමිලේ		දේශීය	දැනුම වර්ධනය කර ඇත.
02	ඉදිකිරීම් උපකරණ නඩත්තු තාක්ෂණයේ ජාතික ඩිප්ලෝමාව	1	වර්ෂ 1	140,000.00		දේශීය	තාක්ෂණ දක්ෂතාවය වර්ධනය කිරීම
03	සංයුක්ත සැලැස්ම වැඩමුළුව විධිමත්ව සකස් කිරීම	35	දින 1	116,325.00		දේශීය	දක්ෂතාවය වැඩි දියුණු කිරීම සංයුක්ත සැලැස්මේ අවසාන විස්තරය
04	KPI වැඩසටහන විධිමත්ව සකස් කිරීම	24	දින 1	5,967.00		දේශීය	දැනුම ලබා ගැනීම KPI නිම කිරීම
	එකතුව	**128**		**262,292.00**			

6.0 අනුකූලතා වාර්තාව

අංකය	අදාල අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල විය /අනුකූල නොවීය)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීම	ඉදිරියේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
1.	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත.			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල විය		
1.2	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	අනුකූල විය		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවීය	අධිකාරිය නිෂ්පාදන කාර්යයන් සිදු කරයි.	
1.4	ගබඩා අත්තිකාරම්	අනුකූල නොවීය	ගබඩා තැබීම අපගේ අධිකාරියේ කාර්යයන් ලෙස නොසැලකේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල විය		
1.6	වෙනත්			
2.	**පොත් හා ලේඛන පවත්වා ගැනීම (FR445)**			
2.1	ස්ථාවර වත්කම් ලේඛන අංක 267/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.2	පුද්ගලික පඩිනඩි ලේඛනය / අනුකූල වීම පුද්ගලික පඩිනඩි කාඩ්පත් පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.3	විගණන විමසුම් ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS)පිළියෙල කර නියමිත දිනට භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත.	අනුකූල නොවීය	(CIGAS)වැඩසටහන යටතේ කටයුතු කිරීමට රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවලට උපදෙස් ලැබී නැත.	පීඊඩී 19 ප්‍රකාරව මාසික ගිණුම් කළමණාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත
2.6	වෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය පවත්වා ගැනීම හා	අනුකූල විය		

	යාවත්කාලීන කිරීම සිදු කර ඇත.			
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.8	තොග ලේඛන පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.9	පාඩු ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.10	බැඳීම් ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.11	අනුපිටපත් පොත් ලේඛනය (GA – N20)පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
3.	**මූල්‍ය පාලනය සඳහා බලතල පැවරීම (මු.රේ. 135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා ඇත	අනුකූල විය		
3.2	ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීම සන්නිවේදනය කර ඇත	අනුකූල විය		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් මඟින් සම්මත කර ගැනීම සඳහා අධිකාරිය විසින් පවරා ඇත.	අනුකූල විය		
3.4	රජයේ වැටුප් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරුන් විසින් 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව පාලනයන් පිළිපැද ඇත.	අනුකූල විය		
4.	**වාර්ෂික සැලසුම් පිළියෙල කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.	අනුකූල විය		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.	අනුකූල විය		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර ඇත.	අනුකූල විය		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ නියමින දිනට භාණ්ඩාගාර මෙහෙයුම්	අනුකූල විය		

	දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.			
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපති විසින් දක්වා ඇති නියමිත දිනට සියළු විගණන විමසුම් වලට පිළිතුරු ඉදිරිපත් කිරීම.	අනුකූල විය		
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූල්‍ය රෙගුලාසි 34 හා DMA 1209 ප්‍රකාරව විගණකාධිපතිගෙන් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම වර්ෂය ආරම්භයේදී පිළියෙල කිරීම.	අනුකූල විය		
6.2	සියලුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මාසයක් ඇතුලත පිළිතුරු සැපයීම.	අනුකූල නොවීය	අදාළ තොරතුරු එකතු කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන්	පිළිතුරක් සඳහා තොරතුරු රැස්කිරීමට කාලය ගත වුවහොත් අතුරු පිළිතුරක් යවනු ලැබේ.
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) වන උප වගන්තිය ප්‍රකාරව සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල විය		
6.4	මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව, සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල විය		
7.	**විගණන හා කළමනාකරණය කමිටු**			
7.1	ඩීඑම්ඒ වක්‍රලේඛ 1-2019 ප්‍රකාරවවර්ෂය තුළ අවම වශයෙන් කළමනාකරණ කමිටු 4 ක් පැවැත්විය යුතුය.	අනුකූල විය		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක 01/2017 හි 07 ඡේදය ප්‍රකාරව වත්කම් මිලදී ගැනීම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු පාලන ජෙනරාල් කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.	අනුකූල විය		

8.2	ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කිරීම. ඉහත චක්‍රලේඛයේ 13 වන ඡේදය ප්‍රකාරව චක්‍රලේඛය සහ පත් කරන නිලධාරියාගේ තොරතුරු පාලක ජනරාල් කාර්යාලයට යවන ලද බව.	අනුකූල විය		
8.3	අංක 05/2016 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව, භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාල වාර්තා විගණකාධිපති වෙත යවන ලද බව.	අනුකූල විය		
8.4	භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත සහ ඌනතා සහ වෙනත් අදාළ නිර්දේශ,පිළිබඳව චක්‍රලේඛයේ දක්වා ඇති කාල පරිච්ඡේදය තුල ක්‍රියාමාර්ග ගන්නා ලද බව.	අනුකූල විය		
8.5	මු.රෙ. 772 ප්‍රකාරව ගර්හිත භාණ්ඩ පිළිබඳ අපහරණයන් සිදු කර ඇති බව.	අනුකූල විය		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහනවල දෛනික ධාවන වාර්තා සහ මාසික සාරාංශ පිළියෙල කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල විය		
9.2	ගර්හිත කිරීමෙන් පසු මාස 06 කට අඩු කාල පරිච්ඡේදයක් තුල ගර්හිත වාහන අපහරණය කිරීම.	අනුකූල නොවීය	කාලය ප්‍රමාණවත් නොවීම	එසේ කිරීම සඳහා යථා කාලයේදී පියවර ගනු ලැබේ.
9.3	වාහන ලොග් පොත් යාවත්කාලීන කිරීම.	අනුකූල විය		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල විය		
9.5	2016.12.29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම.	අනුකූල විය		
9.6	කල්බදු වාහන වල පරම හිමිකාරිත්වය කල්බදු කාලයෙන් පසු මාරු කිරීම.	අනුකූල විය		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය කිරීම**			
10.1	බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල	අනුකූල විය		

	කර, සහතික කර නියමිත දිනට විගණනයට ඉදිරිපත් කිරීම.			
10.2	සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල සිට පවතින අක්‍රීය ගිණුම් නිරවුල් කිරීම.	අනුකූල විය		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ මඟින් අනාවරණය කර ඇති ශේෂයන් සහ ඒ සඳහා සිදු කළ යුතු ගැලපීම් හා මාසයක් ඇතුලත එම ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල විය		
11.	**ප්‍රතිපාදන උපයෝජනය කිරීම**			
11.1	වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාවන් ඉක්මවීමෙන් තොරව වැය කිප රීම.	අනුකූල විය		
11.2	මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා නොයන වර්ෂය අවසානයේ පවතින වගකීම්	අනුකූල විය		
12.	**රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වී ඇත.	අනුකූල විය		
12.2	හිඟව පවතින ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම.	අනුකූල විය		
12.3	වර්ෂයකට අධික හිඟ ණය ශේෂ නිරවුල් කිරීම.	අනුකූල විය		
13.	පොදු තැන්පතු ගිණුම			
13.1	ඉකුත් තැන්පතු අපහරණය කිරීම සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල විය		
13.2	පොදු තැන්පතු පාලන ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ඇත.	අනුකූල විය		
14.	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම.	අනුකූල විය		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කරන තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාසයක් ඇතුලත නිරවුල් කිරීම.	අනුකූල නොවීය	මසකට වැඩි කාලයක් මෙම අත්තිකාරම් පැවතුණි.	අධිකාරියේ වක්‍රලේඛවලට අනුව අත්තිකාරම් නිරවුල් කරන තෙක් වැටුප් අත්හිටුවා ඇත.
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම.	අනුකූල විය		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය මාසිකව භාණ්ඩාගාර පොත් සමඟ සසඳා ඇත.	අනුකූල නොවීය	රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් භාණ්ඩාගාර පොත් පවත්වනු නොලැබේ.	පිරිවැ 19 ප්‍රකාරව මාසික ගිණුම් වාර්තා අධිකාරියේ පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
15.	**ආදායම් ගිණුම**			
15.1	ආදායමෙන් ආපසු ගෙවීම් රෙගුලාසි ප්‍රකාරව සිදු කරනු ලැබේ.	අනුකූල විය		
15.2	ආදායම් එකතු කිරීම් තැන්පතු ගිණුමට බැර කිරීමෙන් තොරව සෘජුවම ආදායමට බැර කරනු ලැබේ.	අනුකූල විය		
15.3	හිඟ ආදායම් වාර්තා මු.රෙ. 176 ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල්ව ඉදිරිපත් කිරීම.	අනුකූල නොවීය	රාජය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලට එසේ කිරීමට උපදෙස් දී නොමැත.	හිඟ ආදායම් වාර්තා විගණන හා කළමණාකරන කමිටුවට සහ අධිකාරියේ කළමණාකරන මණ්ඩලයට ඉදිරිපත් කරයි.
16.	**මානව සම්පත් කළමණාකරනය**			
16.1	අනුමත සේවක සංඛ්‍යාව තුල කාර්ය මණ්ඩලයට ගෙවීම.	අනුකූල විය		
16.2	සියලුම කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට ලිඛිතව රාජකාරි ලැයිස්තු ලබාදී තිබීම.	අනුකූල විය		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තු චක්‍ර ලේඛය ප්‍රකාරව සියලුම වාර්තා එම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල විය		
17.	**මහජනතාව සඳහා තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත හා රෙගුලාසි ප්‍රකාරව, තොරතුරු සැපයීමේ නිලධාරියෙකු පත්කර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන යාම.	අනුකූල විය		
17.2	වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග මගින් ආයතනය පිළිබඳ තොරතුරු මහජනතාවට ලබාදී ඇති අතර මෙම වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග මඟින්	අනුකූල විය		

	අධිකාරිය ඇගයීම/ අධිකාරියට එරෙහිව චෝදනා කිරීම සඳහා පහසු කිරීම.			
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 සහ 10 වගන්ති ප්‍රකාරව ද්වි-වාර්ෂික සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.	අනුකූල විය		
18.	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන සහ කළමනාකරන අමාත්‍යාංශයේ අංක 05/2008 සහ 05/2018 (1)දරන චක්‍රලේඛ ප්‍රකාරව ආයතනය විසින් පුරවැසි ප්‍රඥාප්තියක් / පුරවැසි සේවාදායක ප්‍රඥාප්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.	අනුකූල විය		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥාප්තිය / පුරවැසි සේවාදායක ප්‍රඥාප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියාමනය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සැලසුම් කිරීම.	අනුකූල විය		
19.	**මානව සම්පත් සැලැස්ම සකස් කිරීම**			
19.1	2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඇමුණුමෙහි ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම.	අනුකූල විය		
19.2	ඉහත මානව සම්පත් සැලැස්ම තුල කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වසරකට පැය 12 කට නොඅඩු අවම පුහුණු අවස්ථාවක් සහතික කිරීම.	අනුකූල විය		
19.3	ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි ආකෘතිය මත පදනම්ව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම.	අනුකූල විය		
19.4	ඉහත චක්‍රලේඛයේ අංක 6.5 ඡේදය අනුව, ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර, මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා වර්ධන වැඩසටහන් සංවිධානය කිරීම හා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ඇත.	අනුකූල විය		

20.	විගණන ඡේද සඳහා ප්‍රතිචාර දැක්වීම			
20.1	පෙර වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන ඡේදවල පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීම.	අනුකූල විය		